

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

වාර්ෂික වාර්තාව

2019

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
නො. 46-48, කොටා පාර
කොළඹ 08

පටුන

		පිටුව
කොමිසමෙහි සාමාජිකයන්		3
විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයන්		4
කොමසාරිස්තුමාගේ පණිවිඩය		5-6
1.	**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම**	
1.1	හැඳින්වීම	7
1.2	දැක්ම	7
1.3	මෙහෙවර	7
1.4	පරමාර්ථ	7
1.5	කොමිසමේ බලතල, කර්තව්‍ය හා කාර්යයන්	7-8
1.6	ආයතනික සැලැස්ම	9
1.7	මානව සම්පත	10
2.	**2019 වර්ෂයේ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන්**	
2.1	"සහසක් නිමැවුම් 2019" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය	11-15
2.2	නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය සඳහා නව නිපැයුම් සමාජ පිහිටුවීම	15-16
2.3	ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය	16-17
2.4	නවෝත්පාදන ඇගයුම් විශේෂඥ මණ්ඩලය	17
2.5	පර්යේෂණ එළිදැක්වීමට ජාත්‍යන්තර සමුළුවක් "From Innovation to Impact - FITI 2019"	17-18
2.6	නව නිපැයුම් ප්‍රචලිත කිරීම සඳහා "Sri Lanka Inventors" - YouTube ප්‍රවේශය	18
2.7	දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ අයිතිය සුරැකීම සඳහා සේවාවන් සැපයීම	19
2.8	නව නිපැයුම් වාණිජකරණය සඳහා වන IAFM-SL ව්‍යාපෘතිය	20
2.9	නව නිපැයුම් වාණිජමය පදනමක පිහිටුවීම උදෙසා වන "නව නිපැයුම් දිරිය"	20
2.10	නව නිපැයුම්කරුවනට තාක්ෂණික සහයෝගය ලබාදීම වෙනුවෙන් ස්ථාපිත තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centres)	21
2.11	ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ ප්‍රවේශය	21-29
2.12	නව නිපැයුම්කරුවන්ගේ හමුව	30
2.13	නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා සේවා සැපයීම	30-31
2.14	නව නිපැයුම්කරුවන්ට විශේෂිත සේවාවන්	31-32
2.15	කොමිසමේ නිල වෙබ් අඩවිය හා සබැඳි විශේෂිත සේවාවන්	32
2.16	මානව සම්පත් සංවර්ධනය	33
2.17	මූල්‍ය ප්‍රාග්ධන ප්‍රගතිය	34
2.18	ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සතු අනන්‍ය වූ වත්කම්	35
3.	**මූල්‍ය ප්‍රකාශනය**	36-51

කොමිසමෙහි සාමාජිකයන්

2019.01.01 සිට 2019.04.01 දක්වා

ඩී. නන්දනී සමරවික්‍රම මහත්මිය
[අතිරේක ලේකම් (පාලන හා මුදල්) - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය]
කොමසාරිස් (වැ.බ.)

එල්. සුරේකා එච්. හේවගේ මහත්මිය
[ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය]
සහකාර කොමසාරිස් (වැ.බ.)

ඒ. එල්. එස්. නසීමා මහත්මිය
[අධ්‍යක්ෂ (සැලසුම්) - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය]
සහකාර කොමසාරිස් (වැ.බ.)

ඒ. වී. ජනාදර මහතා
භාණ්ඩාගාර නියෝජිත

2019.04.02 සිට 2019.12.05 දක්වා

මහාචාර්ය රංගික උමේෂ් හල්වතුර මහතා
කොමසාරිස්

මහාචාර්ය එම්. ඩී. දයාල් ප්‍රේමකුමාර ද කොස්තා මහතා
සහකාර කොමසාරිස්

නීතීඥ යසස් චන්ද්‍ර ද සිල්වා මහතා
සහකාර කොමසාරිස්

ඒ. වී. ජනාදර මහතා
භාණ්ඩාගාර නියෝජිත

2019.12.06 සිට 2019.12.31 දක්වා

ඩබ්. ඒ. නිමාලි කුලතුංග මහත්මිය
[අධ්‍යක්ෂ (සැලසුම්) - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය]
කොමසාරිස් (වැ.බ.)

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයන්

2019.01.01 සිට 2019.04.01 දක්වා

එල්. සුරේකා එච්. හේවගේ මහත්මිය
[ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය]
සහකාර කොමසාරිස් (වැ.බ.)

ඒ. එල්. එස්. නසීමා මහත්මිය
[අධ්‍යක්ෂ (සැලසුම්) - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය]
සහකාර කොමසාරිස් (වැ.බ.)

ඒ. වී. ජනාදර මහතා
භාණ්ඩාගාර නියෝජිත

සී. පී. ආර්. බණ්ඩාර මහත්මිය
අභ්‍යන්තර විගණක - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

ඩබ්. පී. එල්. එස්. ආර්. පෙරේරා මහත්මිය
විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිත

2019.04.02 සිට 2019.12.05 දක්වා

මහාචාර්ය එම්. ඩී. දයාල් ප්‍රේමකුමාර ද කොස්තා මහතා
සහකාර කොමසාරිස්

නීතීඥ යසස් චන්ද්‍ර ද සිල්වා මහතා
සහකාර කොමසාරිස්

ඒ. වී. ජනාදර මහතා
භාණ්ඩාගාර නියෝජිත

සී. පී. ආර්. බණ්ඩාර මහත්මිය
අභ්‍යන්තර විගණක - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

එච්. අනුරුද්ධිකා මහත්මිය
අභ්‍යන්තර විගණක - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

ඩබ්. පී. එල්. එස්. ආර්. පෙරේරා මහත්මිය
විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිත

කොමසාරිස්තුමාගේ පණිවිඩය



මහාචාර්ය ආර්. යූ. හල්වතුර
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ
කොමසාරිස්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම බලාත්මක කරන ලද්දේ 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ වන අතර, කොමිසමේ ප්‍රධාන පරමාර්ථය වන්නේ දේශීය නවෝත්පාදනයන් දිරි ගන්වමින්, නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය හා නීතිමය සහයෝගය ලබාදීමයි.

ඒ අනුව, දේශීය නව නිපැයුම්කරුවනට ප්‍රයෝජනවත් වන අයුරින් විවිධාංගීකරණය වූ වැඩසටහන් නිර්මාණය කිරීමට කොමිසම මේ වන විටත් කටයුතු සම්පාදනය කර තිබේ. ඒ හරහා දේශීය නව නිපැයුම්කරුවන් දිරි ගන්වමින් ඔවුන් ගේ නිපැයුම් වැඩිදියුණු කිරීමට අමතරව, දේශීය ආර්ථිකයට පැහැදිලි දායකත්වයක් ලබාදීම සඳහා වෙළෙඳ පොළ අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයෙන් නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීමට වැඩපිළිවෙල සකසා තිබේ.

නවෝත්පාදන පිළිබඳව කැමැත්තක්/ඉල්ලුමක් ඇතිවනුයේ ඒවා සමාජය තුල ප්‍රචලිත වන තරමට ය. එබැවින් නිසි ප්‍රචාරණයක් ලබාදීම තුළින් නව නිපැයුම් සමාජගත කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි. මෙම අරමුණ යතාර්ථයක් බවට පත් කෙරෙන වැඩසටහන් රාශියක් කොමිසම විසින් ක්‍රියාත්මක කරන අතර, ඒ අතරින් "සහසක් නිමැවුම්" සඳහා හිමිවන්නේ විශේෂිත ස්ථානයකි. 2012 වසරේ දී ප්‍රථම වරට ක්‍රියාත්මක කරන ලද එම ජාතික ප්‍රදර්ශනය මෙම වසරේ සිට අන්තර්ජාතික මට්ටමේ නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනයක් ලෙසින් ඉතිහාසගත වෙමින් ක්‍රියාත්මක කරන ලදී. "සහසක් නිමැවුම්" යනු මෙරටදීම විදෙස් නව නිපැයුම් තරඟ අත්දැකීම ලබාගැනීම සඳහා ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට උදෑ වන මාහැඟි අවස්ථාවක් වේ.

තව ද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා නවෝත්පාදනය සමාජගත කිරීමට ද වැඩපිළිවෙලක් සකසා තිබේ. ඒ අනුව "Sri Lanka Inventors" නමින් YouTube දෙරටුවක් හඳුන්වා දෙමින්, ව්‍යාපාරික අවස්ථා සහිත නව නිපැයුම් පිළිබඳව දෙස් විදෙස් ව්‍යවසායකයින් දැනුවත් කිරීමට අවකාශ සලසා තිබේ. නවෝත්පාදන විෂයය කෙරෙහි කැමැත්තක් දක්වන ඕනෑම අයෙකුට එය ඉතාම ආකර්ශනීය ප්‍රවේශයක් වේ.

එමෙන්ම කොමිසමේ නිල වෙබ් පිටුව ද නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමෙහි ලා වැදගත් කාර්යභාරයන් රැසක් ඉටු කරන අතර, මේ වන විට එය නවෝත්පාදකයන් හා ආයෝජකයන් අතර සම්බන්ධතාවයක් ගොඩනගාලිය හැකි ආකාරයෙන් සංස්කරණය කර තිබේ.

එමෙන්ම, නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත ප්‍රකාරව "නව නිපැයුම් සමාජ" පිහිටුවීමට ද කොමිසම කටයුතු කරන අතර, එය 2019 වසරේ දී ඉතාමත් කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුණි. අංකුර නව නිපැයුම්කරුවන් නිර්මාණශීලී මානසිකට යොමු කරවීම හරහා අනාගත ශ්‍රී ලංකාව තුල නවෝත්පාදන සංස්කෘතියක් ගොඩනැංවීමට මෙම වැඩසටහන ප්‍රභල දායකත්වයක් ලබාදෙයි.

වාණිජකරණ විභවයක් සහිත නව නිපැයුම් වෙළෙඳපොළ වෙත ගෙන යෑම සඳහා "IAFM-SL" (Innovation Accelerator Funding Mechanism for Sri Lanka) හා "නව නිපැයුම් දිරිය" නමින් ව්‍යාපෘති ද්විත්වයක් හඳුන්වා දී ඇත. මෙහිදී අයදුම්පත කැඳවීමක් සිදු කරන අතර, විශේෂඥ විනිසුරුවන් ගේ ඇගයීම් අනුව හඳුනාගත් යෝග්‍ය වූ නිපැයුම් වෙනුවෙන් මූල්‍යමය හා තාක්ෂණික සහයෝගය ලබාදීම සිදුකරනු ලබයි. එමෙන්ම තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන පිහිටුවීම මගින් දේශීය නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීමට ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම පියවර ගෙන තිබේ.



එමෙන්ම, නව නිපැයුම් වල සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීම සඳහා බුද්ධිමය දේපළ අයිතිය (පේටන්ට්) ලබාගැනීම වෙනුවෙන් නව නිපැයුම්කරුවන්ට මාර්ගෝපදේශකත්වය ලබාදීමේ විශේෂිත වැඩපිළිවෙලක් ද කොමිසම විසින් ක්‍රියාත්මක කරනු ලබයි. දේශීය මෙන්ම විදේශීය පේටන්ට් අයදුම් කිරීම සඳහා ද දායකත්වය ලබාදීම විශේෂත්වයකි.

එමෙන්ම වී වී වර්ෂයන්ට අදාලව බුද්ධිමය දේපළ හිමිකම ලබාගත් නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන පිරිනැමීම ද සිදු කරනු ලබයි. එම නිපැයුම් ඇගයීම සිදුකෙරෙනුයේ ද ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලයක් මගිනි.

තව ද නව නිපැයුම්කරුවන් මුහුණාපාන ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා "නව නිපැයුම්කරුවන්ගේ හමුව" නමින් විශේෂිත වැඩසටහනක් පවත්වනු ලබයි. එමෙන්ම නව නිපැයුම්කරුවන් සඳහා ශක්‍යතා වර්ධනය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම, ජාත්‍යන්තර තරඟ සඳහා යොමු කරවීම, සෑම වසරකම ඔක්තෝබර් මස 26 දිනට යෙදෙන ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය සැමරීම, නව නිපැයුම්කරුවන් වෙනුවෙන් හැඳුනුම්පත් නිකුත් කිරීම, නව නිපැයුම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම යනාදී වූ එකිනෙකට වෙනස් කාර්යභාරයන් රැසක් ඉටු කිරීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකියාව ලැබී තිබේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මෙතෙක් ආ ගමන් මගෙහි දී උපරිම ශක්තියෙන් සිය සේවය ලබාදුන් සීමිත වූ කාර්යමණ්ඩලයට කෘතවේදීත්වය පල කරන අතර, ඊට නිසි මඟ පෙන්වීමක් ලබාදුන් කොමිසමේ පාලක මණ්ඩල සාමාජිකයින් වෙත ද ප්‍රශංසාව පළ කරමි.

ශ්‍රී ලංකාව තුල දේශීයත්වය අගයන නවෝත්පාදන සංස්කෘතියක් බිහි කිරීමේ දැඩි අපේක්ෂාව මත ක්‍රියා කරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ඉදිරි සැලසුම් සහගත වැඩපිළිවෙල හමුවේ ඔබ වෙතින් ලැබෙන සහෝගය දැවැන්ත ශක්තියක් බව හෘදයාංගමව සඳහන් කරමි.

1.1 හැඳින්වීම

ශ්‍රී ලාංකික නව නිපැයුම් වලට හා ඒවා නිෂ්පාදනය කිරීමට අනුග්‍රහ දැක්වීම හා ධෛර්යය දීම සඳහා ද ඒවාට සම්බන්ධ හෝ අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සලස්වමින් 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. කොමිසම 2019 වර්ෂයේ දී විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

1.2 දැක්ම

"නව නිපැයුම් මවන දැයක් - යස ඉසුරින් පිරුණු හෙටක්"
(නව නිපැයුම් හා නවෝත්පාදන තුලින් සෞභාග්‍යය උදෑ කිරීම)

1.3 මෙහෙවර

ශ්‍රී ලාංකිකයන් ගේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කරවීමේ ප්‍රධාන උත්ප්‍රේරකය ලෙස ක්‍රියා කරමින්, අදහස් ප්‍රායෝගික යෙදවුම් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීමේ පුරෝගාමියා ලෙස කටයුතු කිරීම.

1.4 පරමාර්ථ

1.4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් නව නිපැයුම් කරනු ලැබීම හෝ නිර්මාණය කරනු ලැබීම වෙනුවෙන් ඔවුනට ධෛර්යය දීම.

1.4.2 නව නිපැයුම්කරුවනට තාක්ෂණික, මූල්‍ය හා නීති ආධාර ලබාදීම.

1.4.3 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ සඳහන් සියලු බලතල, කර්තව්‍යය හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

1.4.4 ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය වන හෝ උපකාරී වන වෙනත් සියලු කටයුතු කිරීම.

1.5 කොමිසමේ බලතල, කර්තව්‍ය හා කාර්යයන්

(අ) කොමිසමේ නියමයන්ට හා කොන්දේසීන්ට යටත්ව, නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර අයදුම් කිරීමේ දී අදාල කරුණු පරීක්ෂා කර බලා ඒ ඒ නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික ආධාර ලබාදීම සහ පේටන්ට් අයදුම්පත පිළියෙල කිරීම වෙනුවෙන් උපකාර කිරීම.

(ආ පේටන්ට් බලපත්‍ර නිකුත් කර ඇති නව නිපැයුම් හෝ පේටන්ට් අපේක්ෂිත නව නිපැයුම් වැඩිදියුණු කිරීම, පරිපූර්ණ කිරීම හා නිෂ්පාදනය කිරීම සඳහා කොමිසමේ නියමයන්ට යටත්ව මුදල් ආධාර ලබා දීම.

(ඇ) නව නිපැයුම්කරුවන්ගේ පේටන්ට් බලපත්‍ර දේශීයව හෝ විදේශීයව ඉදිරිපත් කිරීමේ දී ඔවුන් නියෝජනය කිරීමෙන් සහ පේටන්ට් අයිතීන් උල්ලංඝනය කිරීම් වලදී මෙන්ම පේටන්ට් අයිතිය පිළිබඳ නඩු වලදී ඔවුන් ආරක්ෂා කිරීම සඳහා නීති ආධාර දීම.

(ඈ) නව නිපැයුම්වල ගුණාත්මකභාවය මත පදනම්ව එම පේටන්ට් අයිතීන් පමණක් ඇපයට තබාගනිමින් රාජ්‍ය ණය දෙන ආයතන වෙතින් නව නිපැයුම්කරුවනට දීර්ඝකාලීන ණය ලබාගැනීමට හැකි වන පරිදි නිර්දේශයන් ඉදිරිපත් කිරීම. නව නිපැයුමෙහි වැදගත්කම සහ අලෙවිය පිළිබඳව කොමිසම විසින් දෙනු ලබන තීරණය මත රඳා පවතිමින් ණය මුදලේ ප්‍රමාණය නිර්ණය කරනු ලැබේ.

(ඉ) දේශීය නව නිපැයුම් ශ්‍රී ලංකාවේ සහ විදේශයන් හි අලෙවි කිරීම සඳහා නව නිපැයුම්කරුවනට උපකාර කිරීම.

(ඊ) කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ජාතික ආරක්ෂාව, ඖෂධවේදය, භෞතික විද්‍යාව, මහජන ආරක්ෂාව හා සුභසාධනය, පොදු කර්මාන්ත, ප්‍රවාහනය යන ක්ෂේත්‍ර වල සහ වෙනත් එවැනි විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍ර වල එක් එක් වර්ෂයන් හි ශ්‍රී ලංකාවේ දී පේටන්ට් බලපත්‍ර දෙන ලද සියළු ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් සඳහා වාර්ෂිකව ජනාධිපති සම්මාන පිරිනැමීම හරහා දේශීය නව නිපැයුම් ප්‍රකට කිරීම වෙනුවෙන් ඔවුන් ඇගයීම හා ධෛර්යය දීම.

(උ) බලය දෙන ලද නව නිපැයුම්කරුවනට සහ පර්යේෂකයන්ට ස්වකීය අනුමත කළ නව නිපැයුම් සහ පර්යේෂණ කරගෙන යාම සඳහා හෝ ඒවා පරිපූර්ණ කිරීම සඳහා පර්යේෂණ රසායනාගාර හෝ අත්හදබැලීමේ මධ්‍යස්ථාන පහසුකම් හා සේවා ලබාගත හැකි වන පරිදි පොදු පර්යේෂණ රසායනාගාරයක් සහ අත්හදා බැලීම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙන යෑම.

(ඌ) "නව නිපැයුම් පිළිබඳ ජනාධිපති ප්‍රදාන" තරඟ වල ඒ ඒ විනිශ්චයකරුවන් විසින් තෝරාගනු ලබන ජයග්‍රාහකයන්ට මුදල් ත්‍යාග හා පදක්කම් පිරිනැමෙන "නිර්මාණාත්මක පර්යේෂණ තරඟයක්" වාර්ෂිකව පැවැත්වීමෙන් ශ්‍රී ලංකාවේ ජනතාව අතර නව නිපැයුම් කිරීම, නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීම, ඊට ධෛර්යය දීම සහ කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව ආදී වූ විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍ර වල නව නිපැයුම් නිර්මිත කිරීමට ඔවුන්ට සහාය දීම.

(එ) නව නිපැයුම් සහ පර්යේෂණ පිළිබඳවත් පොදුවේ විද්‍යාව පිළිබඳවත් තොරතුරු පළ කිරීම සහ පතළ කර හැරීම.

(ඒ) නව නිපැයුම්කරුවන් අතර අදහස් හුවමාරු කරගැනීම සඳහා මාසික රැස්වීම් නිතිපතා පැවැත්වීම.

(ඔ) නව නිපැයුම් සහ පර්යේෂණ සඳහා පැවැත්වෙන අන්තර්ජාතික තරඟ වලට සහභාගී වීමට ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට උපකාරීවීම හෝ එවැනි තරඟ වලට ඔවුන් නිර්දේශ කිරීම.

(ඕ) ශ්‍රී ලාංකික යෞවනයන් අතර නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීම සහ ඊට ධෛර්යය දීම සඳහා පාසල් වල, විශ්වවිද්‍යාල වල නිර්මාණාත්මක සමිති සංවිධානය කිරීම.

1.6 ආයතනික සැලැස්ම



1.7 මානව සම්පත

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	2019 වර්ෂයේ කාර්ය මණ්ඩලය	2019 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරී)	01	01	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	02	02	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (මුදල්)	01	01	-
නීති නිලධාරී	01	-	01
වැඩසටහන් නිලධාරී	03	03	-
පරිපාලන නිලධාරී	01	01	-
මූල්‍ය නිලධාරී	01	01	-
පර්යේෂණ සහකාර	05	03	02
කළමනාකරණ සහකාර	07	06	01
රියදුරු	04	04	-
කාර්යාල සහායක	02	02	-



2. 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන්

2.1 "සහසක් නිමැවුම් 2019" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය

"සහසක් නිමැවුම්" නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සංවිධානය කරනුයේ ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් සතු නවොත්පාදන කුසලතාවයන් දිරිගන්වමින් එම නිපැයුම් එළිදැක්වීම තුලින් වාණිජකරණය දක්වා වූ මාර්ගය විවර කරදීම වෙනුවෙනි.

2012 වර්ෂයේ දී ප්‍රථම වරට ක්‍රියාවට නංවන ලද "සහසක් නිමැවුම්", මෙම වසරේ දී විදෙස් නව නිපැයුම්කරුවන්ගේ ද සහභාගීත්වයෙන් අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනයක් ලෙස පුළුල් මට්ටමෙන් ක්‍රියාත්මක කරන ලදී. "සහසක් නිමැවුම්" හි ප්‍රධාන අරමුණු වලට අමතරව විදෙස් නව නිපැයුම්කරුවන්ගේ සහභාගීත්වය තුලින් රටට විදේශ විනිමය ගලා ඒම ද ප්‍රතිලාභයකි.

දේශීය තරඟ අංශය විදෙස් තරඟ අංශය වශයෙන් දෙආකාරයකින් අගයන ලද "සහසක් නිමැවුම් 2019", ක්‍රියාවට නැංවෙන්නේ අදියර කිහිපයක ප්‍රතිඵලයක් ලෙසිනි. දේශීය නව නිපැයුම් තෝරාගැනීමේ දී ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක දායකත්වය ඇතිව දිවයිනේ සෑම පළාතක්ම ආවරණය වන පරිදි මූලික ඇගයීම් පවත්වන ලද අතර, එහිදී තෝරාගන්නා ලද, නිර්ණායකයන්ට අනුකූලවූ නව නිපැයුම් සඳහා "සහසක් නිමැවුම් 2019" අන්තර්ජාතික ප්‍රදර්ශනයට සහභාගී වීමේ අවස්ථාව හිමි විය.

විදෙස් නව නිපැයුම් ඇගයීම සඳහා ද ඊටම විශේෂිත වූ අත්දැකීම් සහිත විනිශ්චය මණ්ඩලයක් සම්බන්ධ කරගන්නා ලදී. මලයාසියාව, ඉන්දුනීසියාව හා ඉන්දියාව යන රටවල් නියෝජනය කරමින් අයදුම්පත් දෙක (02) බැගින් සහ ඊජිප්තුවෙන් එක් අයදුම්පතක් වශයෙන් අයදුම්පත් හතක් (07) මෙම ප්‍රථම අන්තර්ජාතික ප්‍රවේශය සඳහා යොමු වී තිබුණි. එය රටක් වශයෙන් අප ලබාගත් ජයග්‍රහණයකි.

දේශීය තරඟ අංශය නියෝජනය කරමින් පාසල්, විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන, වාණිජකරණය වූ නව නිපැයුම් හා විවෘත යන ප්‍රධාන අංශ හතරක් යටතේ පහත දක්වා ඇති තාක්ෂණික ක්ෂේත්‍ර දාහතර (14)ට අදාල වන පරිදි තරඟය සඳහා ඉදිරිපත් වීමට නව නිපැයුම්කරුවනට අවස්ථාව සැලසුනි.

- මහජන අරක්ෂාව, සුභසාධනය හා ජාතික ආරක්ෂාව
- රසායන විද්‍යාව
- ආහාර තාක්ෂණය
- වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය
- සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව
- පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්
- භෞතික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- කෘෂිකර්මය
- ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ
- බලශක්තිය
- පරිසර සංරක්ෂණය
- ප්‍රවාහනය
- ඉංජිනේරු

සහසක් නිමැවුම්" අන්තර්ජාතික නව නිපැයුම් තරඟයට ඉදිරිපත් වන නව නිපැයුම්කරුවන් හට හිමි වන වරප්‍රසාද බොහෝ ය. දෙස් විදෙස් නව නිපැයුම් එකම වේදිකාවකදී ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව හිමි වීම තුල සිය නිර්මාණාත්මක හැකියාවන් හා දක්ෂතාවයන් ඉදිරිපත් කිරීමට අවස්ථාව හිමිවීමට අමතරව විවිධ වූ ජයග්‍රහණ රාශියක් වෙනුවෙන් තරඟ කිරීමටත්, සිය නිපැයුම් වාණිජකරණය සඳහා පසුබිම සකස් වීම මෙන්ම ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විදේශයන් හි පැවැත්වෙන නව නිපැයුම් තරඟ සඳහා සහභාගී වීමට අවස්ථාව සැලසීමත් ඒ අතරින් ප්‍රධාන වේ.

"සහසක් නිමැවුම් 2019" සැප්තැම්බර් මස 20 සිට 22 දින දක්වා කොළඹ 10, ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේදී අට වන වරට සාර්ථක අයුරින් පවත්වන්නට යෙදුණි. මේ පිළිබඳව සමස්ථ ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ අවධානය යොමු කරවීම වෙනුවෙන් පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සියඵම පළාත් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලදී. එම වැඩසටහන් වලදී "සහසක් නිමැවුම්" පිළිබඳව දැනුවත් කිරීමට අමතරව නව නිපැයුම්/නවෝත්පාදනයන් මෙන්ම බුද්ධිමය දේපළ

අයිතිය (පේටන්ට්) පිළිබඳව ද දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. මෙම වසරේ දී පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් එකොළහක් (11) පළාත් මට්ටමින් පහත පරිදි පවත්වන්නට යෙදුණි.

පළාත	දිනය	ස්ථානය
දකුණ	2019 පෙබරවාරි 20, 21, 22	තාක්ෂණ විද්‍යාලය, බෙලිඅත්ත සණස සම්මන්ත්‍රණ ශාලාව, නූපේ තාක්ෂණ විද්‍යාලය, ගාල්ල
සබරගමුව	2019 පෙබරවාරි 26	තාක්ෂණ විද්‍යාලය, රත්නපුර
උතුරු මැද	20192019 මාර්තු 01 හා 02	තාක්ෂණ විද්‍යාලය, අනුරාධපුර
වයඹ	2019 මාර්තු 06 හා 07	උසස් තාක්ෂණ ආයතනය, කුරුණෑගල
මධ්‍යම	2019 මාර්තු 12 හා 13	පේරාදෙණිය විශ්වවිද්‍යාලය
නැගෙනහිර	2019 මාර්තු 16 හා 17	මහජන විද්‍යාලය, මඩකලපුව
උතුර	2019 මාර්තු 19 හා 20	යාපනය විශ්වවිද්‍යාලය
ඌව	2019 මාර්තු 30 හා 31	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
බස්නාහිර	2019 අප්‍රේල් 04 හා 05	ශ්‍රී ලංකා පදනම් ආයතනය

ජාතික තලය නියෝජනය කරන නව නිපැයුම් හඳුනාගැනීම වෙනුවෙන් පළාත් මට්ටමේ ඇගයීම් දාහතරක් (14) පහත පරිදි පවත්වන ලදී.

පළාත	දිනය	ස්ථානය
උතුරු මැද	2019 මැයි 09	තාක්ෂණ විද්‍යාලය, අනුරාධපුර
සබරගමුව	2019 මැයි 11	තාක්ෂණ විද්‍යාලය, රත්නපුර
නැගෙනහිර	2019 මැයි 25	මහජන විද්‍යාලය, මඩකලපුව
උතුර	2019 මැයි 27	පරිගණක විද්‍යා අධ්‍යයනාංශය, යාපනය විශ්වවිද්‍යාලය
ඌව	2019 ජූනි 01	සත්ත්ව විද්‍යා පීඨය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
දකුණ	2019 ජූනි 10 2019 ජූනි 11 2019 ජූනි 12	තාක්ෂණ විද්‍යාලය, බෙලිඅත්ත භෞතික විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, ගාල්ල ඉංජිනේරු පීඨය, හපුගල
මධ්‍යම	2019 ජූනි 15	කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
වයඹ	2019 ජූනි 18	උසස් තාක්ෂණ ආයතනය - කුරුණෑගල
බස්නාහිර	2019 ජූනි 20 2019 ජූනි 21 2019 ජූනි 22 2019 ජූනි 23 2019 අගෝස්තු 30	ඥානෝදය විද්‍යාලය, කළුතර ගුරුකුල විද්‍යාලය, කැලණිය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, කොළඹ 08 ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, කොළඹ 08 ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, කොළඹ 08



පළාත් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන්

මෙවර "සහසක් නිමැවුම්" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සඳහා පාසල්, විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන, වාණිජකරණය වූ නව නිපැයුම් හා විවෘත යන ප්‍රධාන අංශ හතර නියෝජනය වන පරිදි උක්ත සඳහන් තාක්ෂණික ක්ෂේත්‍ර දාහතර (14) ඔස්සේ නව නිපැයුම් තුන්සිය විසි හත (327) ක සංඛ්‍යාවක් සුදුසුකම් ලබා තිබුණි.

සහසක් නිමැවුම් 2019 අන්තර්ජාතික ප්‍රදර්ශනයේ විශේෂ අවස්ථාවන්

















"සහසක් නිමැවුම්" නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනයේ ජයග්‍රාහී නව නිපැයුම්කරුවන් හට සම්මාන පිරිනැමීම ප්‍රදර්ශනයේ අවසන් දින පවත්වන ලදී. සෑම අංශයකම වී වී තාක්ෂණික ක්ෂේත්‍රයෙහි ප්‍රථම ස්ථානය සඳහා රන් පදක්කමක්, දෙවන ස්ථානය සඳහා රිදී පදක්කමක් සහ තෙවන ස්ථානය සඳහා ලෝකඩ පදක්කමක් බැගින් පිරිනමන ලදී. ඊට අමතරව සහතික පත්‍ර හා මුදල් ත්‍යාග ද ලබාදුන් අතර, විශිෂ්ටතම නව නිපැයුම සඳහා "දසිස්" කුසලානය ඇතුළුව සහතික පත්‍ර හා මුදල් ත්‍යාග පිරිනමන ලදී. "දසිස්" යනු නව නිපැයුම් පරපුරේ පෙරළියක් වූ දඬුමොනරය නිර්මාණය කළ රාවණා රජුට අන්වර්ථ නාමයක් වන අතර, එය නූතන නව නිපැයුම් සමඟ ඉතිහාසය යා කරන්නා වූ පෞරාණික වටිනාකමක් ලෙස අර්ථ දැක්විය හැකි ය.

ඒ අනුව දේශීය නව නිපැයුම්කරුවන් සඳහා රන් පදක්කම් 38ක්, රිදී පදක්කම් 36ක් සහ ලෝකඩ පදක්කම් 32ක් ප්‍රදානය කෙරිණි.

විදෙස් තරඟ අංශයේ නව නිපැයුම් සඳහා රන් පදක්කම් 05ක් සහ රිදී පදක්කම් 02ක් පිරිනමන ලදී.

එමෙන්ම මෙම සම්මාන ප්‍රදානෝත්සවයේ දී පාසල් අංශයේ ජයග්‍රාහී නව නිපැයුම්කරුවන් සඳහා මාර්ගෝපදේශකත්වය ලබාදුන් ගුරුභවතුන් ඇගයීම සඳහා මුදල් ත්‍යාගයන් ද පිරිනමන ලදී.

දේශීය නවෝත්පාදන අංශයේ ජයග්‍රාහී නව නිපැයුම්කරුවන් හට ඉදිරියේ දී විදේශයන් හි පැවැත්වෙන නව නිපැයුම් තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වීමේ අවස්ථාව හිමි වීම ද "සහසක් නිමැවුම්" හි විශේෂත්වයකි.

"සහසක් නිමැවුම් 2019", අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය තුළින් ඇ.ඩො. 900 ක් (ආසන්න වශයෙන් රුපියල් 150,000.00) උපයා ගැනීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකියාව ලැබුණි. ඒ සඳහා මහජන බැංකු ගිණුම් අංක 204-4-021-3-1791066 යටතේ නවතම ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යෑමට ද හැකියාව ලැබී ඇත.

2019 වසරේ "දසිස්" කුසලාන ජයග්‍රාහකයන්



වමේ සිට..

විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතන අංශය
ද්විත්ව හා ත්‍රිරෝද රථ සඳහා ආරක්ෂිත, පහසු හා වැඩිදියුණු කළ පද්ධතිය
Safety, Easy and Advanced Handle System for Two and Three Wheels
(මෙත්දසුන් සඳමාල්)

විවෘත අංශය

ළිං සඳහා ස්වාභාවික ජල පවිත්‍රකරණ පද්ධතිය
Natural Water Purification System Inbuilt Water Well
(එච්. කේ. එස්. පී. වීරන්ද)

වාණිජකරණ අංශය

උරස් කුහර තරල සඳහා නිෂේධ පීඩක බෝතල් රැඳවුම් ට්‍රොලිය
Push Cart for Chest Drain Bottle
(රංජිත් රාජපක්ෂ)

පාසල් අංශය
නූල් පැටලීම වැළැක්වීමේ සිපරය
Thread Cluttering Preventive Zip
(දිනිති දක්ෂිණා රාජපක්ෂ)

2.2 නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය සඳහා නව නිපැයුම් සමාජ පිහිටුවීම

ශ්‍රී ලංකාව තුල නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැපයීම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රධාන වගකීම් අතර වේ. අනාගත පරම්පරාව තුළ නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කොමිසම වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත.

යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම මඟින් පාසල්, විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් අතර නවෝත්පාදන සංස්කෘතියක් ඇති කිරීම සඳහා වැඩසටහනක් කොමිසම විසින් ආරම්භ කර තිබේ.

පාසල් යොවුන් නව නිපැයුම් සමාජ 111 ක් 2019 වර්ෂය තුල කොමිසම මඟින් ස්ථාපිත කර ඇති අතර, ශ්‍රී ලංකාව තුල පවතින කාර්මික විද්‍යාල 39 තුලම යොවුන් නව නිපැයුම් සමාජ දැනටමත් ස්ථාපිත කර ඇත.

එම යොවුන් නව නිපැයුම් සමාජ සඳහා දැනුවත් කිරීමේ සැසි 12 ක් 2019 වර්ෂයේදී දිවයින පුරා පවත්වන ලදී.

නව නිපැයුම් හා නවෝත්පාදන පිළිබඳ දැනුවත් කිරීමේ සැසි, නව නිපැයුම් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා මූල්‍යාධාර (රු. 30,000/- දක්වා අදියර දෙකක් යටතේ), සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය ලබාදීම ආදී විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රතිලාභ ගණනාවක් ලබා ගැනීමට තුළින් ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කර ගැනීමට මෙම නව නව නිපැයුම් සමාජ පිහිටුවීම හරහා අවකාශ ලැබේ.

	ස්ථාපිත කළ නව නිපැයුම් සමාජ සංඛ්‍යාව	පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	රු. 15,000/- බැගින් මූල්‍යාධාර නිකුත් කරන ලද සමාජ ගණන
පාසල්	111	8	60
තෘතියික අධ්‍යාපන ආයතන	39	4	0



2.3 ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් විසින් ඉටු කරන්නා වූ මෙහෙවර හා දේශීය ආර්ථිකය වෙනුවෙන් ලබාදෙන්නා වූ දායකත්වය ඇගයීම සඳහා සෑම වසරකම ඔක්තෝබර් මස 26 වන දින ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය ලෙස ප්‍රකාශයට පත් කර තිබේ. ශ්‍රේෂ්ඨ ඉංජිනේරුවරයෙකු මෙන්ම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රථම කොමසාරිස් ධූරය හෙබවූ දේශබන්දු ආචාර්ය ඒ. එන්. එස්.

කුලසිංහ මැතිතුමන් විසින් ඉටු කළ අපරිමිත සේවාව ඇගයීම උදෙසා එතුමන් ගේ ජන්ම දිනය පාදක කර ගනිමින් මෙම දිනය නම් කර තිබේ.

ජාතික නව නිපැයුම්කරුවන් ගේ දිනය ස්ථාපිත කිරීමේ අරමුණු

- නව නිපැයුම්කරුවන් ඇගයීම සඳහා නව වැඩපිළිවෙලක් සකස් කිරීම හා නව නිපැයුම්කරණය කෙරෙහි ඔවුන් දිරි ගන්වමින් නවෝත්පාදන ආර්ථිකයක් කරා රට මෙහෙයවීම.
- නව නිපැයුම්කරුවන් හා සමීප වීම සඳහා කොමිසමට අවස්ථාවක් ලබා ගැනීම.
- නව නිපැයුම්කරුවන්ගේ දිනය ප්‍රකාශයට පත්කිරීම මඟින් නව ආයෝජන අවස්ථා ලබාදීම කෙරෙහි නව නිපැයුම්කරුවන් ගේ අවධානය ලබාගැනීම.
- නව සොයාගැනීම් තුළින් සංවර්ධිත ආර්ථිකයක් සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලාංකීය නිපැයුම්කරුවන්ට ප්‍රමුඛත්වය ලබා දීම.
- සම්මානනීය නව නිපැයුම්කරුවන් හඳුනාගැනීම.

2.4 නවෝත්පාදන ඇගයුම් විශේෂඥ මණ්ඩලය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් වසර මුළුල්ලෙහි ක්‍රියාවට නංවන විවිධ ස්වරූපයේ වැඩසටහන් අතර, නව නිපැයුම් විනිශ්චයට හිමිවන්නේ විශේෂිත ස්ථානයකි. විවිධ තාක්ෂණික ගැටළු ඉලක්ක කරමින් නිපදවන නව නිපැයුම්, සමාජගත කිරීමේ දී නිවැරදිව ශ්‍රේණිගත කිරීම ඉතාමත් වැදගත් අවශ්‍යතාවයකි. මෙම භාරදූර කර්තව්‍යය සාර්ථකව ඉටු කිරීම සඳහා විවිධ ක්ෂේත්‍රයන් හි නිපුණතා සහිත විද්වතුන් වෙතින් අයදුම්පත් කැඳවන අතර, එම සංචිතය ආශ්‍රයෙන් වර්ෂය පුරාවට ක්‍රියාත්මක නවෝත්පාදන වැඩසටහන් හි විනිශ්චය කටයුතු සිදු කරනු ලබයි. මෙම වසරේදී ද ප්‍රවීණයන් 177 දෙනෙකු ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් එම ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ මත පත් කර ගැනීමට කොමිසම කටයුතු කර ඇත.

2.5 පර්යේෂණයන් එළිදැක්වීමට ජාත්‍යන්තර සමුළුවක් "From Innovation to Impact - FITI 2019"

නව නිපැයුම් ප්‍රචලිත වීම සඳහා එම නිර්මාණශීලීත්වය නිවැරදිව සමාජගත විය යුතු ය. ඒ සඳහා නව නිපැයුම්කරුවන්ගේ නව අදහස්, නව පර්යේෂණ එම නිපැයුම්කරුවාට සීමා නොවී ජාත්‍යන්තරය දක්වා ව්‍යාප්ත විය යුතු ය. ඒ අනුව නවෝත්පාදකයන් හට සිය පර්යේෂණාන් එළිදැක්වීම, නව නිපැයුම් පිළිබඳව හැදෑරීම මෙන්ම තම පර්යේෂණ අවශ්‍යතා සඳහා මාර්ගෝපදේශකත්වය ලබාගැනීම වෙනුවෙන් "From Innovation to Impact (FITI) 2019" නමින් සුවිශේෂී ජාත්‍යන්තර සමුළුවක් ලංකා ඉතිහාසයේ පළමු වරට පවත්වන ලදී. මෙය 2019 නොවැම්බර් 22 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී ජාත්‍යන්තර නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන්නට යෙදුණි.

මෙම සමුළුවේ ප්‍රධාන දේශනය එක්සත් රාජධානියේ අපද්‍රව්‍ය හා සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය කාල් විලියම්ස් විසින් පවත්වන ලදී. ඒ හැරුණු විට "පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ සමාජ බලපෑම" පිළිබඳව "Lanka Software Foundation" නිර්මාතෘ ආචාර්ය සන්ජීව වීරවරණ හා "සමාජ නවෝත්පාදන" පිළිබඳව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සියේ (ICT Agency) සභාපති මහාචාර්ය රොහාන් සමරජීව මෙන්ම "යොවුන් නව නිපැයුම්කරුවෙකුගේ අදහස්" යන මැයෙන් වයඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය හේලි සෙනෙවිරත්න මෙනෙවිය විසින් ද දැනුවත් කිරීමේ දේශන පවත්වන ලදී. ඉන් අනතුරුව පවත්වන ලද්දේ පර්යේෂණයන්

ඉලක්ක කරගත් තාක්ෂණික සැසියයි. මෙය ප්‍රධාන අංශ දෙකක් යටතේ පවත්වන ලදී. "Social Innovations" මාතෘකාව යටතේ පර්යේෂණ පත්‍රිකා හත (07) ක් ද "R & D. Innovations and Their Societal Impact" යටතේ පර්යේෂණ පත්‍රිකා හත (07) ක් ද වශයෙන් පත්‍රිකා 14ක් විශ්ලේෂණය කරන ලදී.

මෙම සමුළුව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සමඟ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (Sri Lanka Association for the Advancement of Science-SLAAS) එක්ව සංවිධානය කරන ලදී.



2.6 නව නිපැයුම් ප්‍රචලිත කිරීම සඳහා "Sri Lanka Inventors" -YouTube ප්‍රවේශය

වාණිජකරණය සඳහා යෝග්‍ය දේශීය නව නිපැයුම් විධිමත්ව ලෝකයට විවෘත කිරීම හරහා නව නිපැයුම්කරුවන්ට අභිමානය ලඟා කර දීමත්, දෙස් විදෙස් ආයෝජකයන් වෙතින් එම නිපැයුම් වාණිජකරණයට සහාය ලබාගැනීමත් අරමුණු කරගනිමින් නවීන තාක්ෂණය ආශ්‍රයෙන් ලෝකය සමඟ ඉදිරියට ගමන් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර දීම සඳහා 2019 වසරේ ජූනි මස සිට අලුතින් ක්‍රියාත්මක කළ වැඩසටහනකි. එමෙන්ම නවක නිපැයුම්කරුවන්ට නවෝත්පාදනය පිළිබඳව දැනුවත්භාවයක් ලබාගැනීමටත්, පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව අවබෝධයක් කඩිනමින් සහ ඕනෑම අවස්ථාවක ලබාගැනීමටත් මෙම චැනලය හරහා අවකාශ සලසා දී තිබේ.



2.7 දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ අයිතිය සුරැකීම සඳහා සේවාවන් සැපයීම

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් ගේ නිර්මාණ අයිතීන් සුරකිමින් දේශීය වශයෙන් ලබාදිය හැකි උසස් තත්ත්වයේ තාක්ෂණික දැනුම සහ අදාල සේවාවන් ලබාදීමත්, ඔවුන් ගේ නවෝත්පාදන හැකියාවන් අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම වළක්වාලමින් බුද්ධිමය දේපළ අයිතිය සුරක්ෂිතව කළමනාකරණය කිරීමත් වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හැකි උපරිම අයුරින් සහයෝගය ලබාදෙයි. මේ සඳහා අවශ්‍ය විධිමත් දැනුම ලබාගැනීම වෙනුවෙන් කොමිසමේ කාර්යමණ්ඩලය ලෝක බුද්ධිමය දේපළ කාර්යාලය හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ සහයෝගය මත තාක්ෂණ නවෝත්පාදන සහයෝගිතා මධ්‍යස්ථාන (Technology and Innovation Support Center - TISC) යටතේ මනා පුහුණුවක් ලබා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙත මෙම වසර තුලදී පේටන්ට් අයදුම්පත් 32 ක සංඛ්‍යාවක් යොමු කර ඇත. බුද්ධිමය දේපළ අයිතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ එය ඉල්ලුම් කිරීමට අදාල මූල්‍යමය සහයෝගය ලබාදීම හරහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වාර්ෂිකව අයදුම් කෙරෙන පේටන්ට් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම කටයුතු කරනු ලබයි.

එමෙන්ම දේශීය නව නිපැයුම්කරුවන් හට ජාත්‍යන්තර පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ ගාස්තු, පේටන්ට් සහයෝගිතා ගිවිසුම් (PCT) ගාස්තු මෙන්ම නෛතික කටයුතු සඳහා අදාල ගාස්තුව ද ප්‍රතිපූරණය වෙනුවෙන් කොමිසමේ සහයෝගය ලබාදීම සිදු කරයි. එම සේවාව ලබාගැනීම සඳහා නව නිපැයුම්කරු විසින් ගෙවීම් පිළිබඳ සාක්ෂි සහ රටට එමගින් හිමි වන සමාජ, ආර්ථික, පාරිසරික හා වෙනත් ප්‍රතිලාභයන් පිළිබඳ පිළිගත හැකි ආයෝජන සැලැස්මක් සමඟ ලිඛිත ඉල්ලීමක් කොමිසම වෙත ඉදිරිපත් කළ යුතු ය.

- පේටන්ට් තොරතුරු පරීක්ෂා කිරීම සඳහා සහාය - 15
- පේටන්ට් බලපත්‍ර වර්තා කෙටුම්පත් කිරීම - 15
- පේටන්ට් අයදුම් කිරීමේ ගාස්තු ප්‍රතිපූරණය - 32
- පේටන්ට් බලපත්‍ර අළුත් කිරීමේ ගාස්තු ප්‍රතිපූරණය - 04
- ජාත්‍යන්තර පේටන්ට් අයදුම් කිරීම සඳහා මූල්‍ය සහාය - 02
- පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) සඳහා මූල්‍ය සහාය - 03

මේ වන විට 2016 අයවැය යෝජනා අංක 375 අනුව මැදවච්චිය, කරන්දෙණිය, නොච්චියාගම යන ප්‍රදේශ වල නවෝත්පාදන ආධාරක මධ්‍යස්ථාන 03ක් ස්ථාපිත කිරීමට කටයුතු යොදා ඇත.



2.8 නව නිපැයුම් වාණිජකරණය සඳහා වන IAFM-SL ව්‍යාපෘතිය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වෙළෙඳ පොළ දක්වා ගෙන යාමට හා පර්යේෂණ සඳහා සහාය දක්වමින් ඒවා මුදල් බවට පරිවර්තනය කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් IAFM-SL (Innovation Accelerator Funding Mechanism for Sri Lanka) ව්‍යාපෘතිය රේඛීය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ කැබිනට් අනුමැතියක් මගින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත පවරා ඇත. මෙය කොමිසමේ පනත මගින් දක්වා ඇති නව නිපැයුම් වානිජකරණය සඳහා සහාය ලබාදීම වෙනුවෙන් ක්‍රියාත්මක ය. නව නිපැයුමක් ලෙස බිහි වූ අවස්ථාවේ සිට වාණිජ්‍යකරණය වූ නිමි භාණ්ඩයක් ලෙස සමාජ ගත වෙමින් නව නිපැයුම්කරුට පෞද්ගලිකව හා රටේ දේශීය අදායමට දායකත්වය සැපයීම සඳහා පහසුකම් සැලසීම, මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. මූල්‍යාධාර/ ණය සඳහා අයදුම් කළ පසු අධීක්ෂණ කටයුතු පියවර ගණනාවක් යටතේ සිදු කරනු ලබයි.

2019 වසරේ දී මෙම වැඩසටහන සඳහා ලැබුණු අයදුම්පත්‍ර ඇගයීම වෙනුවෙන් තාක්ෂණික කමිටුවේ සාමාජිකයන් පත් කර ගැනීම සඳහා නාම යෝජනා කැඳවීම වෙනුවෙන් ඒ ඒ ආයතනයන් වෙත ලිපි යොමුකොට නිර්දේශිත නාමයන් ලබාගත් අතර, පාලක මණ්ඩලය අනුමැතිය ද ලබාගන්නා ලදී. කොමිසම වෙත ලැබී තිබූ අයදුම්පත්‍ර විනිශ්චය කටයුතු සඳහා යොමු කිරීමට දින හා නව නිපැයුම්කරුවන් වෙත කැඳවීම් ලිපි යොමු කිරීමට කටයුතු සූදානම් කර තිබූ අවස්ථාවේ හටගත් දේශපාලන තත්ත්වය මත පාලක මණ්ඩලය සංශෝධනය වීම සහ තාක්ෂණික කමිටුවේ සභාපතිත්වය හිමිවන කොමසාරිස් ධූරය වෙනස් වීම මත මෙම කටයුතු අවලංගු කරන ලදී. 2019 වසර සඳහා ලැබූ අයදුම් පත්‍ර සංඛ්‍යාව 08ක් වන අතර එම අයදුම් පත්‍ර 2020 වසර තුල දී විනිශ්චය කිරීම සඳහා යොමු කර ඇත.

2.9 නව නිපැයුම් වාණිජමය පදනමක පිහිටුවීම උදෙසා වන "නව නිපැයුම් දිරිය"

කොමිසම තුල ක්‍රියාත්මක නව නිපැයුම් වාණිජකරණයට ඇවැසි සහාය ලබාදීමේ අනෙක් වැඩසටහන "නව නිපැයුම් දිරිය - INVENT Grant Scheme " නමින් ක්‍රියාත්මක කරනු ලබයි. වාණිජ්‍යකරණය සඳහා වෙළඳපොල විභවයක් සහිත නව නිපැයුම් විද්වත් ඇගයීම් මඩුල්ලක සහභාගීත්වයෙන් අධීක්ෂණය කරන ලදුව ක්ෂේත්‍ර පරීක්ෂාවකින් තහවුරු කර, එම නිරීක්ෂණ රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතත්වයෙන් යුතු මූල්‍ය කමිටුවට ලබාදෙයි. එහිදී ගනු ලබන තීරණ පාලක මණ්ඩලයේ අනුමැතියෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ක්‍රමවේදය තුලදී නව නිපැයුම් සඳහා මූල්‍යාධාර ලබාදීම වෙනුවට පොළී රහිතව, නැවත පියවීමට විකඟත්වය ඇති කර ගත් කාල සීමාව තුලදී එම මුදල නව නිපැයුම්කරු විසින් ගෙවිය යුතු වෙයි. ඇගයීම් කමිටුවේ නිර්දේශ මත නව නිපැයුම නිමි භාණ්ඩයක් දක්වා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය හෝ පරීක්ෂණ වාර්තා රාජ්‍ය ආයතනයක් හරහා ලබා ගැනීමට මූල්‍ය දායකත්වය ලබා දීම, පොළී රහිත ණය ලබාදීම, මූලාකෘති සකස් කිරීමට රාජ්‍ය ආයතනයක් හරහා සහයෝගය දැක්වීම යනාදී වශයෙන් විවිධ පැතිකඩ ඔස්සේ සහාය දක්වනු ලබයි.

මීට අමතරව මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සිසුන් විසින් නිෂ්පාදිත Formula Student SAE විදුලි කාරය සඳහා බැටරිය වෙනුවෙන් යුරෝ 8620.56 හෙවත් රුපියල් 1,736,942.88 ක ප්‍රධානයක් ලබා දෙන ලදී.

ඒ අනුව 2019 වසර සඳහා රුපියල් 1,599,500.00 ක් වටිනා යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදනය අනුව යමින් ලබාදී ඇති අතර, තවත් නව නිපැයුම්කරුවන් 70 ක ගේ ඇගයීම් හා ක්ෂේත්‍ර නිරීක්ෂණ 16ක් සිදු කර ඇත. ඉන් හතර දෙනෙක් මූල්‍ය කමිටුව වෙත යොමු කර ඇත.

මීට අමතරව වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශිත නව නිපැයුම් 22ක් ජාතික ඉංජිනේරු සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය වෙත යොමු කරන ලදුව රුපියල් 422,621.93 මුදලක් එම ආයතනය වෙත ගෙවා ඇත.

2.10 නව නිපැයුම්කරුවනට තාක්ෂණික සහයෝගය ලබාදීම වෙනුවෙන් ස්ථාපිත තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centres)

ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වාණිජකරණය සඳහා වූ මාර්ගය සකස් කිරීම වෙනුවෙන් එම නිපැයුම් වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීමට මෙම ජාතික නවෝත්පාදන බීජෝෂණ මධ්‍යස්ථාන පිහිටුවන ලදී. ඒ අනුව ජා-ඇල පිහිටි ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි හා යාපනය විශ්වවිද්‍යාලයෙහි මේ වන විට මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කර ඇත.

2019 වසර සඳහා තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන තෝරාගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාල 05 කින් ලැබුණු ව්‍යාපෘති යෝජනා ඇගයීම් කටයුතු සම්පූර්ණ කර, එයින් රජරට හා රුහුණ යන විශ්වවිද්‍යාල වල තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා එම ව්‍යාපෘති යෝජනාවල මූලික අංග සඳහා එකඟත්වය පල කර ඇත. එම යෝජනා වාර්තා වැඩිදුර විමර්ශනය කරමින්, අමාත්‍යාංශ ලේකම්තුමාගේ සහභාගීත්වයෙන් රැස්වීම් වාර 03ක් පවත්වන ලදී. එම යෝජනාවන් වැඩිදියුණු කර, කොමිසම වෙත බාර දීමට උපදෙස් දී ඇත. මිලියන 35කට අධික මුදලක් මේ සඳහා වෙන් කර ඇත.



2.11 ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ ප්‍රවේශය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් ගේ දක්ෂතා ජාත්‍යන්තරය වෙත ගෙන යෑම සඳහා සුවිශේෂී මඟපෙන්වීමක් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙතින් ලබාදෙයි. මෙම ජාත්‍යන්තර තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වීමට නව නිපැයුම්කරුවන්ට ලැබෙන අවස්ථාව හුදෙක් විදෙස් තරඟ අත්දැකීමක් පමණක් වන්නේ නැත. එම අවස්ථාව තුලින් නවෝත්පාදකයන් හට නවතම සංකල්ප හඳුනාගැනීමට අවස්ථාව සැලසීම, විවිධ තාක්ෂණයන් නව නිපැයුම හා අදාල කරගන්නා ආකාරය හඳුනාගැනීම, විවිධ රටවල නව නිපැයුම්කරුවන් සමඟ අදහස්, දැනුම යනාදිය හුවමාරු කරගැනීමට හැකිවීම, නව නිපැයුම වාණිජකරණය සඳහා අවශ්‍ය පසුබිම සකස් වීම යනාදී ප්‍රධාන ප්‍රතිලාභයන්ට අමතරව විවිධ රටවල සංස්කෘතීන් අධ්‍යයනයට අවස්ථාවක් හිමිවීම, එම තරඟ වලින් ලැබෙන ජයග්‍රහණ හේතුවෙන් රටට කීර්තියක් අත්වීම, සන්නිවේදන කුසලතාවයන් වැඩිදියුණු වීම හා නව නිපැයුම්කරුවාට පුද්ගලිකව ලැබෙන්නාවූ දැනුම් සම්භාරය ද වැදගත් කොට සැලකිය යුතු ය.

මෙම වසර තුල කොමිසමේ මූලිකත්වයෙන් තායිලන්තය, කොරියාව, කැනඩාව හා ඉන්දුනීසියාව යනාදී වූ රටවල පැවැති නව නිපැයුම් තරඟ සඳහා සහභාගී වූ ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් විශේෂ සම්මාන 15ක්, රන් සම්මාන 32ක්, රිදී සම්මාන 33ක් හා ලෝකඩ සම්මාන 07ක් ලබාගැනීමට සමත්වී තිබේ. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම "ලෝක නව නිපැයුම් බුද්ධිමය දේපළ ආයතනයේ" [World Invention Intellectual Property Association (WIIPA)] හා "ජාත්‍යන්තර නව නිපැයුම්කරුවන්ගේ සංවිධානයේ" [International Federation of Inventors' Association (IFIA)] ද සාමාජිකත්වය දරන ශ්‍රී ලංකාවේ නියෝජිත ආයතනය යි.

තායිලන්ත ජාතික පර්යේෂණ සභාව (National Research Council of Thailand) විසින් සංවිධානය කරන ලද IPITEx-2019 (International Intellectual Property, Invention, Innovation and Technology Exposition) ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශනය 2019 පෙබරවාරි මස 02 සිට 06 වන දින දක්වා තායිලන්තයේ බැංකොක් නුවර දී පැවැත්විණි. ඒ සඳහා සහභාගී වූ ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් සුවිශේෂී ජයග්‍රහණ රැසක් හිමි කර ගනිමින් ශ්‍රී ලංකාවට කීර්තියක් අත් කර දීමට සමත් විය. ඔවුන් ලබාගත් ජයග්‍රහණ පහත පරිදි වේ.

නව නිපැයුම්කරු	නව නිපැයුමේ නම	ජයග්‍රහණය
ඩබ්ලිව්. පී. බී. පී. ද සිල්වා කේ. ආර්. රන්ජිත් කරුණාරත්න ඩබ්ලිව්. ආර්. එම්. පෙරේරා	මුද්‍රල් නෝට්ටු පරීක්ෂා කිරීමේ යෙදවුම Note Review App	• රන් සම්මානය • ඉන්දියානු නව නිපැයුම් සංගමයේ ඇගයීම් සහතිකය
මෙත්දසුන් සඳමාල්	ද්විත්ව හා ත්‍රිරෝද රථ සඳහා ආරක්ෂිත, පහසු හා වැඩිදියුණු කළ පද්ධතිය Safety, Easy and Advanced Handle System for Two and Three Wheels	• රන් සම්මානය • ලෝක කාන්තා ව්‍යවසායකයින්ගේ සංගමයේ විශේෂ සම්මානය • ඉන්දියානු නව නිපැයුම් සංගමයේ ඇගයීම් සහතිකය
එම්. සී. එම්. අනීස්	යාන්ත්‍රික ටයර ආධාරකය Mechanical Tyre Helper	• රිදී සම්මානය • හොංකොං විශේෂ සම්මානය • ඉන්දියානු නව නිපැයුම් සංගමයේ ඇගයීම් සහතිකය
එස්. විනෝජ් කුමාර්	සපත්තු ආධාරකය Shoes Helper	• රිදී සම්මානය • මැකාවෝ සම්මානය • බ්‍රිතාන්‍ය නව නිපැයුම් සංගමයේ විශේෂ ත්‍යාගය
	කම්බි සකස්කිරීමේ මෙවලම Wire Building Tool	• ලෝකඩ සම්මානය • සිංගප්පූරු විශේෂ සම්මානය • ඉන්දියානු නව නිපැයුම් සංගමයේ ඇගයීම් සහතිකය
	ද්විත්ව රෝද ආධාරකය Two Wheels' Helper	• ලෝකඩ සම්මානය • පිලිපීන රන් සම්මානය





❖ ලෝක නව නිපැයුම් නවෝත්පාදන තරඟය 2019
World Invention Innovation Contest (WiC) 2019

නවෝත්පාදනය ප්‍රචලිත කිරීමේ ජාතික නියමුවා වන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ අනුග්‍රහය මත 2019 ජූනි මස 15 හා 16 දිනයන් හි කොරියාවේ සෝල් නුවර පැවති "ලෝක නව නිපැයුම් හා නවෝත්පාදන තරඟය" සඳහා නව නිපැයුම් ඉදිරිපත් කිරීමට දේශීය නවෝත්පාදකයන්ට අවස්ථාව හිමි විය.

මෙහිදී රන් සම්මාන තුන (03) ක්, රිදී සම්මාන තුන (03) ක් සමගින් පූර්ව විශිෂ්ටතා සම්මානයක් හා පළමු ශ්‍රේණියේ සම්මානයක් මෙන්ම විශේෂ සම්මාන පහ (05) ක් ද වශයෙන් ජයග්‍රහණ රැසක් හිමි කර ගැනීමට ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ට හැකියාව ලැබුණි.

රන් සම්මාන හිමි කර ගත් නව නිපැයුම්කරුවන් හට තරඟයට සහභාගී වීම සඳහා සෝල් නුවරට යාම වෙනුවෙන් කොමිසමේ පූර්ණ අනුග්‍රහය ලබාදුන් අතර, රිදී සම්මානලාභීන් වෙනුවෙන් තරඟ ලියාපදිංචිය මෙන්ම පදක්කම් හා සහතිකපත්‍ර වෙනුවෙන් අනුග්‍රහය ලබාදීමට කටයුතු කරන ලදී. ඔවුන් ලැබූ ජයග්‍රහණ පහත පරිදි වේ.

නව නිපැයුම්කරු	නව නිපැයුමේ නම	ජයග්‍රහණය
විජයපාල වෙල්ගම	අලි වෙසෙන සීමාව නිර්ණය කිරීමේ ක්‍රමවේදය Elephant Distance Tracer & Chaser for Human Safety	• රන් සම්මානය • පූර්ව විශිෂ්ටතා සම්මානය • පළමු ශ්‍රේණියේ සම්මානය
	මානව ආරක්ෂක කදම්භය Human Safety Beam	• රිදී සම්මානය • විශේෂ සම්මානය
	ඕනෑම ආපදා තත්ත්වයකදී දිවි ගලවා ගැනීමට උපකාරී වන මෙවලම Survival Kit for Any Disaster	• රිදී සම්මානය • විශේෂ සම්මානය
ඩබ්. ඩී. එස්. ශ්‍රීමාල් ප්‍රනාන්දු	රැහැන් රහිත අනතුරු ඇඟවීමේ පද්ධතිය Fire and Anti-Thief GSM Wired/Wireless Alarm System	• රන් සම්මානය • විශේෂ සම්මානය
යූ. චාර්තීපන්	නව ආදර්ශ සැකසුම් උපකරණය New Model Maker	• රන් සම්මානය • විශේෂ සම්මානය
ටී. එම්. කමලජිත් තඹවිට ටී. එම්. මෙවන්යා තඹවිට ටී. එම්. සෙලීනා තඹවිට	ලංකා කුරුඳු ආශ්‍රිත නවෝත්පාදන Ceylon Cinnamon Innovations	• රිදී සම්මානය • විශේෂ සම්මානය



❖ කොරියා ජාත්‍යන්තර කාන්තා නව නිපැයුම් ප්‍රදර්ශනය
Korea International Women's Invention Exposition 2019

කොරියා ජාත්‍යන්තර කාන්තා නව නිපැයුම් ප්‍රදර්ශනය, නවෝත්පාදකයින්ගේ සංසදය හා ඇකඩමිය යන වැඩසටහන් මාලාව, 2019 ජූනි මස 20 සිට 25 දින දක්වා දකුණු කොරියාවේ සෝල් නුවර දී පැවැත්විණි. මෙම තරඟය සඳහා රටවල් 28ක් නියෝජනය කරමින් නව නිපැයුම් 373ක සංඛ්‍යාවක් ඉදිරිපත් කර තිබූ අතර, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මෙහෙයවීම මත සහභාගී වූ තිදෙනෙකු ගෙන් සමන්විත ශ්‍රී ලංකා කණ්ඩායම විශේෂ ත්‍යාගයක් ද සමඟ රන් පදක්කමක්, රිදී පදක්කමක් හා ලෝකඩ පදක්කමක් දිනාගැනීමට සමත් විය.

මෙම තරඟයට සහභාගී වූ කාන්තා නව නිපැයුම්කාරිනියන් තෝරාගන්නා ලද්දේ කොමිසම විසින් වාර්ෂිකව සංවිධානය කරන "සහසක් නිමැවුම්" නව නිපැයුම් හා නවෝත්පාදන තරඟයේ දී 2018 වර්ෂය තුල " විවෘත", "විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතන" මෙන්ම "වාණිජකරණ" යන අංශ යටතේ ලබාගත් ජයග්‍රහණ අතරිනි.

KIWIE 2019 "වැඩසටහන, කොරියානු කාන්තා නව නිපැයුම්කරුවන්ගේ සංගමය (KWIA) විසින් ලෝක බුද්ධිමය දේපල සංවිධානයේ සහාය ඇතිව සංවිධානය කරන ලද අතර, කොරියානු බුද්ධිමය දේපළ කාර්යාලය (KIPO) විසින් එහි සත්කාරකත්වය දරන ලදී.

තරඟයේ දී ශ්‍රී ලංකාව ලබාගත් ජයග්‍රහණ පහත පරිදි වේ.

නව නිපැයුම්කරු	නව නිපැයුමේ නම	ජයග්‍රහණය
ටී. එම්. ආර්. කේ. සෙනෙවිරත්න	ස්වභාවික කෙඳි භාවිතා කර නිපදවන ලද වහළ සෙවිලි තහඩු Developing Roofing Sheets Using Natural Fibre	• රන් පදක්කම • ඩොන්ග්ඩුක් කාන්තා විශ්වවිද්‍යාලයේ සභාපති වෙතින් පිරිනමන විශේෂ ත්‍යාගය
ජේ. සී. අයි. නිශාන්ති	සනිපාරක්ෂක සහ අනෙකුත් ජීව අපද්‍රව්‍ය බැහැර කරලීමේ කාර්යක්ෂම කසල දාහකය Safe Disposal of Sanitary Wear Using Incinerator	රිදී පදක්කම
ඩී. කේ. ප්‍රියන්ති මල්ලිකා	සුදුළුණු අයිස් ක්‍රීම් Garlic Ice-Cream	ලෝකඩ පදක්කම





❖ සිවු වන කැනඩා අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන තරඟය
4th International Invention and Innovation Competition in Canada

කැනඩාවේ ටොරොන්ටෝ නුවර දී 2019 අගෝස්තු මස 24 දින පැවැති අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන තරඟය සඳහා ඉදිරිපත් කෙරුණු ශ්‍රී ලාංකේය නව නිපැයුම් සඳහා රන් සම්මාන 21 ක් හා රිදී සම්මාන 17 ක් වශයෙන් ජයග්‍රහණ රැසක් හිමි විය.

තරඟය සඳහා අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත් කැඳවන අතර, පූර්ව ඇගයීමක් මත මූලික ජයග්‍රහණ තීරණය කිරීම මෙම තරඟයේ ස්වභාවයයි. ඉන් අනතුරුව එම නිපැයුම් භෞතිකව විනිශ්චයට ලක් කරනු ලබයි.

නව නිපැයුම් හා ජයග්‍රහණ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

නව නිපැයුම්කරු	නව නිපැයුමේ නම	ජයග්‍රහණය
එස්. එන්. සී. එම්. ඩයස්	ඉවතලන පැළෑටි හා රෙදිපිළි තන්තු වලින් ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය Development of building materials from plant and waste textile fibers	රන් සම්මානය
මෙතුක රියොන් ද සිල්වා	බර උසුලන්නන් සඳහා ආධාරක උපකරණය Helping device for weight trainees	රන් සම්මානය
ආසිරි ද සිල්වා	පළිබෝධ විකර්ශක මේස දරනුව Pest repellent eco table mat	රන් සම්මානය
	විදුලි ආරක්ෂකය Electricity protector	රන් සම්මානය
	විද්‍යුත් මී විකර්ශක උපකරණය Electronic/smart rat repellent	රන් සම්මානය
ඩබ්. එස්. ආර්. තමෙල් කේ. ජී. ඩී. ඩිවොන් ලයන්ත	ස්වයංක්‍රිය දුම්රිය ගේට්ටු පාලක පද්ධතිය Automated rail gate control system	රන් සම්මානය
ඩබ්. එස්. ආර්. තමෙල්	වාහන ප්‍රධාන ලාම්පු ආලෝක පාලක උපකරණය Headlight dimming device for vehicles	රන් සම්මානය
	දෘශාබාධිත පුද්ගලයන් හට මඟ පෙන්වන උපකරණය Guiding device for blind people	රන් සම්මානය
බී. යූ. සිරිමාන්න	සේදුම් බේසම් අවහිරතා ඉවත් කිරීමේ උපකරණය Unblock sink waste	රන් සම්මානය
ආර්. එම්. එච්. එම්. ඒ. අයි. හේරත්	"ස්ලයිඩස්කෝප්" "Slidescope" a novel video laryngoscope	රන් සම්මානය
ඩබ්. ඩී. එස්. ශ්‍රීමාල් ප්‍රනාන්දු	රැහැන් රහිත අනතුරු ඇඟවීමේ පද්ධතිය Fire and anti-thief gsm wired/wireless alarm system	රන් සම්මානය
ආර්. ජී. සමන් විජේසේකර	ඖෂධීය දුමාරය මගින් පළතුරු ඉදවීමේ උපකරණය Herbal smoke based fruit ripening apparatus	රන් සම්මානය
	තෙතමනය උරාගන්නා නැවත භාවිතා කළ හැකි කඩදාසි Reusable moisture absorbent paper	රන් සම්මානය
කේ. ආර්. චතුර මධුමාල්	ඇවිදීම් ආරෝපණ උපකරණය Walking charger	රන් සම්මානය
විජයපාල වෙල්ගම	මානව ආරක්ෂක කදම්භය Human safety beam	රන් සම්මානය
කේ. ඩී. එස්. සී. චින්තක	පරිපථ පුවරු පරීක්ෂණ උපකරණය L.E.D bulb inside have been s.m.d printed circuit board testing instrument	රන් සම්මානය

චාමික ඉනෝමාල් ගමගේ	හදිසි අනතුරු වලින් ආරක්ෂාවීම සඳහා භාවිතා කළ හැකි නවීන හිස රැඳවුම් උපකරණය Headrest with spring-loaded window braking system and emergency self-inflatable lifesaving buoy	රන් සම්මානය
විහාරා සඤ්ජනී රණසිංහ	සැහැල්ලු බරක් සහිත අතේ ගෙන යා හැකි ස්වයංක්‍රීය ලාම්පුව Upper body wearable, light-weight and portable automatic lamp	රන් සම්මානය
ඩබ්. එම්. එස්. වර්ණකුලසූරිය	නව කාබනික පොහොර Organic fertilizer - natural magic booster	රන් සම්මානය
එච්. බී. ඩබ්. තිලකරත්න	ආරක්ෂිත ද්‍රව මට්ටම් දර්ශකය Industrial safety liquid level indicator	රන් සම්මානය
තිවින්යා රවින්දි ප්‍රේමරත්න	බලශක්ති සුරැකුම් බහුකාර්ය ගෑස් උඳුන Energy saving multifuntional gas cooker	රන් සම්මානය
එස්. සෙල්වදසන්	දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා බාධක හඳුනාගැනීමේ සැරයටිය Free bat	රිදී සම්මානය

නව නිපැයුම්කරු	නව නිපැයුමේ නම	ජයග්‍රහණය
මෙතුක රයොන් ද සිල්වා	විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වන සේදුම් බේසම Special washing basin for handicapped people	රිදී සම්මානය
ආසිරි ද සිල්වා	ආරක්ෂාකාරී විදුලි දිගුව Guardian extension code	රිදී සම්මානය
	නවීන තවාන් බඳුන Modified nursery plant pot	රිදී සම්මානය
ටී. එම්. කමලජිත් තඹවිට එච්. පී. හර්ෂි නිශාමිනි ටී. එම්. මෙවන්යා මින්දුලි තඹවිට ටී. එම්. එස්. මෙවන්ජිත් තඹවිට එන්. කේ. කුලසිංහ	ලංකා කුරුඳු ආශ්‍රිත නවෝත්පාදන Ceylon cinnamon innovations	රිදී සම්මානය
ඩබ්. එස්. ආර්. තමෙල්	ඇඳුම් මැසීම් යන්ත්‍ර අධීක්ෂණ පද්ධතිය Sewing machine monitoring system	රිදී සම්මානය
ඩබ්. ඩී. එස්. ශ්‍රීමාල් ප්‍රනාන්දු	රැහැන් රහිත අනතුරු හැඟවීම් පද්ධති ආශ්‍රිත ව්‍යාජ අනතුරු හැඟවීම් අනාවරකය Automatic portable false alarm detector on wireless alarm systems	රිදී සම්මානය
	ප්‍රවාහ පරිමාව මැනීමේ ඩිජිටල් උපකරණය Portable digital smart flow volume measuring and sms sender funnel	රිදී සම්මානය
කේ. ජී. කේ. ඩී. සුමනදස	පොල් මුද්‍රණ ලන්සය Coconut printing lansa	රිදී සම්මානය
ජේ. ඩී. කේ. ජී. කොටුවේගෙදර	මෘදුකාරක ආලේපනය KS Emollient	රිදී සම්මානය
යූ. චාර්තීපන්	නව සළකුණුකරණය New model marker	රිදී සම්මානය
විජයපාල වෙල්ගම	අලි වෙසෙන සීමාව නිර්ණය කිරීමේ ක්‍රමවේදය Elephant distance tracer & chasser for human safety	රිදී සම්මානය
	ඕනෑම ආපදා තත්ත්වයකදී දිවි ගලවා ගැනීමට උපකාරී වන කට්ටලය Survival kit for any disaster	රිදී සම්මානය
කමල් ලසන්ත වීරසිංහ	වගා මාධ්‍ය සඳහා විකල්ප මූලාශ්‍ර Alternative sources of growing medium/s for the horticulture industry instead of coco peat, rockwool and sphagnum peat moss	රිදී සම්මානය
	බට රහිත නව වායුතාපකය Newly designed tubeless air heater	රිදී සම්මානය
එස්. එන්. ගුණසිංහ	කාර්මික බහුකාර්ය දුරස්ථ ආධාරකය Industrial multi remote assistant unit	රිදී සම්මානය
ආර්. ඩී. මාන්නගේ	පරිසර හිතකාමී භූගත ටැංකිය Environment-friendly layer base septic tanks(s)	රිදී සම්මානය

❖ කොරියානු ජාත්‍යන්තර යොවුන් ඔලිම්පියාඩ් තරඟාවලිය
Korea International Youth Olympiad (KIYO 2019)

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන "සහසක් නිමැවුම් 2018" ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනයේ පාසල් අංශයේ රන් සම්මාන දිනාගත් ජයග්‍රාහී නව නිපැයුම්කරුවන් හට මෙම තරඟයට සහභාගී වීමේ අවස්ථාව හිමි විය. ඒ අනුව 2019 ඔක්තෝබර් මස 05 සහ 06 දිනයන් හි කොරියාවේ සෝල් නුවර පැවති නව නිපැයුම් පිළිබඳ ජාත්‍යන්තර යොවුන් ඔලිම්පියාඩ් තරඟාවලියේදී (KIYO 2019) විශේෂ ඇගයීම් සම්මාන 03 ක්, රන් පදක්කම් 03 ක්, රිදී පදක්කම් 06ක් හා ලෝකඩ පදක්කම් 04 ක් ද දිනාගැනීමට ඔවුන් සමත් විය.

නව නිපැයුම්කරු	නව නිපැයුමේ නම	ජයග්‍රහණය
පී. ඩී. පසිඳු මිහිරාන්	මදුරු ව්‍යාප්තිය වළක්වන උපකරණය Modified yoghurt cup to prevent spreading of mosquitoes	රන් පදක්කම විශේෂ ඇගයීම් සම්මානය
නදීශ බණ්ඩාර තෙන්නකෝන්	තුනී පටල ආලේපන යන්ත්‍රය Ultra-thin film coating machine	රන් පදක්කම විශේෂ ඇගයීම් සම්මානය
කේ. පී. යෙෂාන්	සතුන් පලවාහැරීමට යොදගන්නා ආරක්ෂිත දුරස්ථ පාලකය Remote controlling safety firing - to drive away animals	රන් පදක්කම විශේෂ ඇගයීම් සම්මානය
පසිඳු ගුණරත්න	දැවමය ඇණ සැකසුම් යන්ත්‍රය Machine of producing wood nails	රිදී පදක්කම
තරුෂි පතිරත්න	රාහු කාල නිර්ණ ඔරලෝසුව Rahu time indicator clock	රිදී පදක්කම
	පහසු ආහාර ඇසුරුම Easy food packet	රිදී පදක්කම
ටී. ඩී. ටී. වීරසිංහ	දෙදෙල් මිශ්‍රණය සැකසීමේ යන්ත්‍රය Dodol batter mixing equipment	රිදී පදක්කම
යූ. සනාතනන්	අගුළු හැරීම් අනතුරු හඟවනය Unlocked positioning alarm lock - lock with alarm to indicate unlocked position	රිදී පදක්කම
බෝසිළු ද සිල්වා	ස්වයංක්‍රීය පරිගණක පාලකය Automatic computer controller	රිදී පදක්කම
ජනිඳු බණ්ඩාර	ගල් පාපිස්ස Stone Carpet	ලෝකඩ පදක්කම
දිනෙත් රාජසේකර	වැඩිදියුණු කළ නියපොතු කපනය Clipper of nail cutter	ලෝකඩ පදක්කම
විරාජ් චාමික	මැණික් පරීක්ෂකය Smart gem tester	ලෝකඩ පදක්කම
උදාර දෙව්මික	එළවළු හා පළතුරු පහසුවෙන් ප්‍රවාහනය කළ හැකි බහාලුම Vessel with easy transportation for vegetables & fruits	ලෝකඩ පදක්කම



❖ 6 වන අන්තර්ජාතික යොවුන් නව නිපැයුම්කරුවන්ගේ තරඟාවලිය
6th International Young Inventors Award - IYIA 2019

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ පූර්ණ අනුග්‍රහය මත ඉන්දුනීසියාවේ ජකර්තා නුවර පැවති 6 වන අන්තර්ජාතික යොවුන් නව නිපැයුම්කරුවන්ගේ තරඟාවලිය නියෝජනය කිරීමට ශ්‍රී ලංකාවේ යොවුන් නව නිපැයුම්කරුවන්ට අවස්ථාව සැලසුනි. "සහසක් නිමැවුම් 2018" ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනයේ දී රන් හා රිදී සම්මාන හිමි කර ගත් පාසල් අංශයේ නව නිපැයුම්කරුවන් අතරින් මෙම තෝරාගැනීම සිදු කෙරුණි. තරඟය 2019 ඔක්තෝබර් මස 09 සිට 12 දින දක්වා පැවැති අතර, මෙහිදී විශේෂ සම්මානයක්, රන් පදක්කම් හතර (04) ක්, රිදී පදක්කම් හය (06) ක් සහ ලෝකඩ පදක්කම් දෙක (02) ක් දිනාගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය.

නව නිපැයුම්කරු	නව නිපැයුමේ නම	ජයග්‍රහණය
ජී. ඩබ්. තිමිත් නවෝද්‍ය	මෝටර්රථ අවරෝධක සංවේදකය Car Buffer Sensor	• රන් පදක්කම • විශිෂ්ටතම පර්යේෂණ නව නිපැයුම සඳහා පිරිනැමෙන විශේෂ තෑගය
සුපුන් සසිප්‍රිය සිල්වා	ඇවිදීමට ආධාර දෙන සුහුරු උපාංගය Walk Enhancing Smart Device	රන් පදක්කම
එන්. ජී. සී. ටී. බී. ගමගේ	මූල්‍ය ආයතන සඳහා ආරක්ෂක පද්ධතිය Security System for Financial Institutes	රන් පදක්කම
එන්. ඩබ්. ඩී. ඒ. එස්. අමන්දක එස්. එච්. බී. ප්‍රමුදිත	ස්වයංක්‍රීයව මාළු ඇල්ලීමේ උපකරණය Automatic Fish Catcher	රන් පදක්කම
එච්. කේ. ගිම්හාන් සිල්වා හිරුණි වීරකෝන්	නවීකරණය කරන ලද බහුකාර්ය හිරමණය Modified Multipurpose Scraper	රිදී පදක්කම
කේ. බී. වයි. වී. ප්‍රනාන්දු	රැහැන් ආරක්ෂා කිරීමේ යන්ත්‍රය A Machine to Safe the Cables	රිදී පදක්කම
ජී. එන්. ගම්මම්පිල	කාණු වල ඇති ජලය ඉවත් කිරීමේ මෙවලම Gutter Water Removing Tool	රිදී පදක්කම
ඒ. ඩෙරන්ස්	ශරීරය පිරිසිදුකරණය Body Cleaner	රිදී පදක්කම
එච්. ජී. සී. දිල්ශාන්	පොල් ලෙලි ඉවත් කිරීමේ යන්ත්‍රය Machine to Remove Coconut Husk	රිදී පදක්කම
කේ. මුගේස්රම්	ආරක්ෂිත හිස් ආවරණය Safety Helmet	රිදී පදක්කම
ඩබ්. ඒ. එන්. පී. අමරසූරිය	ජල මට්ටම් පාලකය Intelligent Water Level Controller	ලෝකඩ පදක්කම
ආර්. එම්. කේ. එන්. ජී. රත්නායක	ආරක්ෂිත ඉටිපන්දම් රඳවනය A Safety Candle Holder	ලෝකඩ පදක්කම





❖ කෞශියෝන් ජාත්‍යන්තර නව නිපැයුම් හා සැලසුම් ප්‍රදර්ශනය
Kaohsiung International Invention and Design EXPO (KIDE) 2019

තායිවානයේ කෞශියෝන් හි දී 2019 දෙසැම්බර් 06 සිට 08 දක්වා පැවැති මෙම ජාත්‍යන්තර තරඟය සඳහා සහභාගීවීමට "සහසක් නිමැවුම් 2019" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනයේ දී පාසල් අංශය නියෝජනය කරමින් රන් පදක්කම් දිනාගත් ජයග්‍රාහකයන් හට අවස්ථාව හිමි වූ අතර, ඒ සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ පූර්ණ අනුග්‍රහය හිමි විය. මෙහිදී විශිෂ්ටතම අන්තර්ජාතික යොවුන් නව නිපැයුම්කරු සඳහා පිරිනැමෙන සම්මානය සහ විශේෂ සම්මාන දෙකක් (02), රන් පදක්කම් අටක් (08) හා රිදී පදක්කම් හතරක් (04) දිනාගැනීමට ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් සමත් විය.

නව නිපැයුම්කරු	නව නිපැයුමේ නම	ජයග්‍රහණය
ජේ. එම්. එම්. මිනුපමා බන්ඩාර	අස්ථි බිඳීම් හා මාංශපේශි වේදනාව සඳහා ආයුර්වේද ආලේපනය (Ayurvedic cream for bone fractures and muscular pain)	විශිෂ්ටතම අන්තර්ජාතික යොවුන් නවනිපැයුම්කරුට හිමි සම්මානය
	මදුරුවන් පලවාහරින පරිසර හිතකාමී කාබනික ද්‍රවය (Environment friendly mosquito repellent organic liquid)	රන් පදක්කම
දිනිති දක්ෂිණා රාජපක්ෂ	නූල් පැටලීම වැළැක්වීමේ සිපරය (Thread cluttering preventive zip)	විශේෂ සම්මානය සහ රිදී පදක්කම
එස්. බ්‍රජිත්	මිටිය සහායක උපකරණය (Hammer helper)	විශේෂ සම්මානය සහ රිදී පදක්කම
යසඳු තිසත් සීනපටබැඳීගේ	කුරුඳු බයෝචාර් ශීතකරණ දුගඳ ඉවත් කිරීමේ උපකරණය (Cinnamon biochar fridge deodorizer)	රන් පදක්කම
ඩබ්ලිව්. පී. එස්. ලක්ෂිත	තේ දළු නෙලීමේ යන්ත්‍රය (Tea cutting machine)	රන් පදක්කම
සකිත් රන්සන විජේසිංහ	බහුකාර්ය වාෂ්ප උපකරණය (Multi purpose boiler steamer basket)	රන් පදක්කම
වෙහාන් හන්සජ එදිරිසිංහ පී. පී. ජී. නවිඳු යසින්ත	නෙළුම් මල් කැපීමේ යන්ත්‍රය (Lotus flower cutting machine)	රන් පදක්කම
කේ. එම්. පූර්ණ නිලස් බන්ඩාර	දූරියන් ලෙලි ගැසීමේ යන්ත්‍රය (Durian husking machine)	රන් පදක්කම
එම්. අයි. එම්. අයියාශ්	ආරක්ෂිතව ගස්වල අතු ඉවත් කිරීමේ උපකරණය (Safe branch removing device)	රන් පදක්කම
බිනෙත් සයුරංග පීල්ලවත්ත	ලිපි ආරක්ෂණ ශබ්ද උපකරණය (Letter security alarm box)	රන් පදක්කම
ඩබ්ලිව්. ජී. දසුන් මතීෂ	පාංශු කැපීමේ යන්ත්‍රය (Small soil cutting machine)	රිදී පදක්කම



2.12 නව නිපැයුම්කරුවන් ගේ හමුව

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සපයන සේවාවන් උපරිම මට්ටමෙන් නව නිපැයුම්කරුවන් වෙත ලබාදීම සඳහා ඔවුන් හට පැනනැගී ඇති ගැටළු හඳුනා ගනිමින් ඒ සඳහා ක්‍රමවත් විසඳුම් ලබාදීම අවශ්‍ය වේ. ඒ අනුව, වරින් වර "නව නිපැයුම්කරුවන්ගේ හමුව" පැවැත්වීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම කටයුතු කරනු ලබයි.

මෙම වසරේ ප්‍රථම හමුව 2019 මාර්තු මස 08 වන දින නව නිපැයුම්කරුවන් චිකසිය පණස් හතර දෙනෙකුගේ සහභාගීත්වයෙන් ජාතික විද්‍යා පදනමේ දී පවත්වන්නට යෙදුණි. දෙවන හමුව 2019 මැයි මස 21 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්විණි. මෙම වැඩසටහන් ද්විත්වයම විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ගරු අමාත්‍යතුමන් ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.



2.13 නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා සේවා සැපයීම

නව නිපැයුම් හා නවෝත්පාදනයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හරහා ප්‍රජාව නිපැයුම්කරණයෙහි උනන්දු කරවීමටත්, ඔවුන් සතු නිර්මාණාත්මක කුසලතාවයන් නිවැරදි මාර්ගයට යොමු කරවාගැනීමටත් කොමිසම නිරන්තරයෙන් දීපව්‍යාප්තව වැඩසටහන් සංවිධානය කරයි. ඒ අනුව 2019 වසරේ දී ද කොළඹ 14 උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා ආයතනයේ (HNDE) හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම පීඨය ඇතුළුව පොළොන්නරුව දිස්ත්‍රික්කය හා කළුතර දිස්ත්‍රික්කය ද ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් හයක් (06) පැවැත්වීමට කටයුතු කර ඇත.

එමෙන්ම පාසල්, විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතනයන් හි පැවැත්වෙන නව නිපැයුම් තරඟාවලි ඇගයීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සිය විනිශ්චය මණ්ඩල සංචිතය හරහා දායකත්වය ලබාදෙයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, යුද්ධ හමුදා පර්යේෂණ විශ්ලේෂණ ප්‍රක්ෂේපණ හා සංවර්ධන ශාඛා - බටහිර හා නැගෙනහිර (කිලිනොච්චි, මුලතිවු, වන්නි) යනාදී වශයෙන් සහයෝගය ලබාදීමට කටයුතු කර ඇත. තව ද ඔක්තෝබර් 03 වන දින ලෝක ළමා දිනයට සමගාමීව පුත්තලම, ශාන්ත ඇන්ඩෘ විද්‍යාලය විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනය සඳහා ද නව නිපැයුම් විනිශ්චය මණ්ඩලය සම්පාදනය කරමින් සහාය දක්වා ඇත.

එමෙන්ම, මොරටුව වේල්ස් කුමරු විද්‍යාලයේ සහ ගාල්ල "Samsons Compound Private Limited" හි සංවිධානය කරන ලද නවෝත්පාදන වැඩසටහන් සඳහා දේශකයින් ලෙස සම්පත්දායකත්වය ලබාදීමට ද කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (Sri Lanka Association for the Advancement of Science-SLAAS) විසින් සංවිධානය කරන ලද සමස්ථ ලංකා නව නිපැයුම්කරුවන්ගේ තරඟයෙහි (All Island School Inventors' Competition-2019) ජයග්‍රාහකයන් ගේ පදක්කම් ඇතුළු මුද්‍රණ කටයුතු, තරඟකරුවන්ගේ හා ආචාර්යවරුන් ගේ ආහාර පාන මෙන්ම නවාතැන් පහසුකම් සම්පාදනය වෙනුවෙන් ද පූර්ණ අනුග්‍රහය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙතිනි.

එමෙන්ම 2019.04.08 සිට 12 දින දක්වා රජය මගින් සංවිධානය කරන ලද "රට වෙනුවෙන් එකට සිටිමු" - මඩකලපුව දිස්ත්‍රික් වැඩසටහන සඳහා සහභාගී වෙමින්, නව නිපැයුම් හා නවෝත්පාදන පිළිබඳව නරඹන්නන් දැනුවත් කිරීමට ද කටයුතු කරන ලදී.

තව ද මාතලේ දිස්ත්‍රික්කයේ ජනතා අවශ්‍යතාවයන් ඉලක්ක කරමින් 2019.05.24 සිට 27 දින දක්වා පැවැත්වුණු "රාජ්‍ය සේවය ගමට ගෙන යන ජනතා සේවය" වැඩසටහන සඳහා සක්‍රීය දායකත්වයක් ලබාදෙමින්, නව නිපැයුම්කරණය පිළබඳව දැනුවත් කිරීමටත්, එම වැඩසටහන පැවැත්වීමට කේන්ද්‍ර කර ගත් මාතලේ හින්දු විද්‍යාලයෙහි නව නිපැයුම් සමාජයක් පිහිටුවමින් ඔවුන් ගේ නවෝත්පාදන හැකියාවන් ඉදිරියට ගෙන යාමට සහාය වීමටත් පියවර ගන්නා ලදී.

රාජ්‍ය ප්‍රතිපත්ති අනුව 2019.07.24 සිට 27 දින දක්වා ක්‍රියාත්මක කරන ලද "Enterprise Sri Lanka" ප්‍රදර්ශනය සඳහා නව නිපැයුම්කරුවන් හට සහභාගී වීමට අවස්ථාව සලසා දුන් අතර, නව නිපැයුම් හා නවෝත්පාදනයන් පිළිබඳව දැනුවත් කිරීමට ද කටයුතු කරන ලදී.



2.14 නව නිපැයුම්කරුවන්ට විශේෂිත සේවාවන්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම යනු සීමිත ශ්‍රම බලකායක් තුළින් ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ට හැකි සෑම අයුරකින්ම උපරිම සේවාවක් සැපයීමට කටයුතු කරන ආයතනයකි. කොමිසම සතුව වෙනමම පර්යේෂණාගාරයක් නොමැති වුව ද දේශීය නව නිපැයුම්කරුවන්ගේ පර්යේෂණ අවශ්‍යතාවයන් සපුරා ගැනීම වෙනුවෙන් විවිධාකාර වූ සහයෝගයන් නිර්මාණය කර දෙනු ලබයි. එහි එක් පියවරක් වන්නේ පෙර සඳහන් කරන ලද තාක්ෂණික බීජෝෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centres) පිහිටුවීම යි.

ඊට අමතරව කාර්මික තාක්ෂණ ආයතනය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය වැනි ආයතන වෙත ද නව නිපැයුම්කරුවන් ගේ පර්යේෂණ අවශ්‍යතාවයන් යොමු කරනු ලබයි. මෙලෙස පර්යේෂණයන් සඳහා වන පිරිවැය ප්‍රතිපූරණය කරනුයේ ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසිනි.

ඒ අනුව මෙම වසරේ දී නව නිපැයුම් 42 ක් සඳහා පර්යේෂණ සහයෝගයන් ලබාදීමට කොමිසම විසින් කටයුතු කර ඇත.

ඊට අමතරව නව නිපැයුම්කරුවන් සඳහා ව්‍යාපාරික දැනුම ලබාදීමට හා ව්‍යාපාර සැලසුම් සකස් කිරීම වෙනුවෙන් වැඩමුළුවක් (Business Skills and Business Proposal Writing Workshop) 2019.10.20 දින ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම පරිශ්‍රයේ දී පවත්වන ලදී. මේ සඳහා නව නිපැයුම්කරුවන් 104 දෙනෙකු සහභාගී විය.

එමෙන්ම, නව නිපැයුම්කරුවන්ගේ පර්යේෂණ දැනුම ඉහළ නැංවීම සඳහා 2019 නොවැම්බර් මස 01 වන දින ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය වෙත නිරීක්ෂණ චාරිකාවක් සංවිධානය කිරීමට ද කොමිසම විසින් කටයුතු කරන ලදී. ඒ සඳහා නව නිපැයුම්කරුවන් 53 දෙනෙකු සහභාගී විය.



2.15 කොමිසමේ නිල වෙබ් අඩවිය හා සබැඳි විශේෂිත සේවාවන්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ නිල වෙබ් අඩවිය ආකර්ශනීය නව මුහුණුවරකින් යුතුව 2019 සැප්තැම්බර් මස 20 වන දින ජනතාව අතරට මුදා හරින ලදී. නව නිපැයුම්කරුවන්, ආයෝජකයන් මෙන්ම නවෝත්පාදනයන්ට හිතැති ශ්‍රී ලාංකිකයන් ගේ වැඩිමනත් ප්‍රයෝජනය උදෙසා පුළුල් සේවාවක් සැපයීම වෙනුවෙන් එය නිර්මාණය කර ඇත.

කර්මාන්ත ක්ෂේත්‍රයේ මතුවන ගැටළු සඳහා විසඳුම් සෙවීම වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හරහා නිපැයුම්කරුවන් සමඟ සම්බන්ධවීමේ අවස්ථාව ද මෙම වෙබ් අඩවිය සතු වීම සුවිශේෂී වේ.



2.16 මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දේශීය නව නිපැයුම්කරුවන් වෙනුවෙන් උපරිම සේවාවක් සැලසීම වෙනුවෙන් සුවිසල් මෙහෙවරක නිරත වන ආයතනයකි. නව නිපැයුම්කරුවන් වෙනුවෙන් ලබාදෙන එම සේවාව ගුණාත්මක හා කාර්යක්ෂමතාවයෙන් ඉහළ සේවාවක් බවට පත් කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවය ඉහළ නැංවීම ද අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව ඔවුන් විෂයානුබද්ධව විවිධ පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත. පහත දැක්වෙන්නේ 2019 වසර තුල කාර්ය මණ්ඩල නිපුණතා වෙනුවෙන් සහභාගීත්වය ලබාදුන් වැඩසටහන් පිළිබඳ තොරතුරු ය.

දිනය	වැඩසටහනේ නම හා මෙහෙයුම් ආයතනය	යොමු කළ සංඛ්‍යාව
2019.02.07, 08	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි ***නිපුණතා සංවර්ධන අරමුදල***	01
2019.02.21	Lessons from the British public sector to improve our public sector performance (දේශීය රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා බ්‍රිතාන්‍ය රාජ්‍ය අංශයෙන් ලබාදෙන පුහුණුව) ***ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලය***	03
2019.02.25, 26	කාර්යාල උපකරණ පිළිබඳ පාලනය ***නිපුණතා සංවර්ධන අරමුදල***	01
2019.03.01	Workshop for R & D trends and evolution (පර්යේෂණ හා සංවර්ධන ප්‍රවනතා ඇගයීම පිළිබඳ වැඩමුළුව) ***ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය***	01
2019.05.16,17	Procurement Procedure (ප්‍රසම්පාදන ක්‍රමවේද) ***නිපුණතා සංවර්ධන අරමුදල***	04
2019.05.21, 22	MS Project ***ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම***	සියළුම කාර්ය මණ්ඩලය
2019.06.27	Workshop on Effective Research Proposal Writing (ඵලදායී පර්යේෂණ යෝජනා ලිවීම පිළිබඳ වැඩමුළුව) ***ජාතික විද්‍යා පදනම***	08
2019.10.03, 04	International Conference on Social and Cultural Nexus of Science and Technology Development (විද්‍යා හා තාක්ෂණ සංවර්ධනයේ සමාජ හා සංස්කෘතික සම්බන්ධතාවය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව) ***ජාතික විද්‍යා පදනම***	01
2019.11.27	Research Methodologies (පර්යේෂණ ක්‍රමවේද) ***ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය***	04
2019.11.29	End to End Statistical Data Analytics (සංඛ්‍යාන දත්ත විශ්ලේෂණය) ***ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය***	06
2019.12.04	අභිප්‍රේරණ වැඩමුළුව ***ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම***	සියළුම කාර්ය මණ්ඩලය
මාස 14ක පාඨමාලාව (සතියට වක් දිනක් බැගින්)	Higher National Diploma in Public Procurement and Contract Administration (රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව) ***ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය***	01

තව ද සමස්ථ කාර්ය මණ්ඩලය ඒකරාශී වන අයුරින් ක්‍රියාකාරී වක් දින පුහුණු වැඩසටහනක් (Outbound Training) 2019 ජූලි 13 වන දින කොස්ගම, බොරළුගොඩ "චේ ඇඩ්වෙන්චර් පාක්" (CHE Adventure Park) හි දී පැවැත්වුණි.



2.17 මූල්‍ය ප්‍රාග්ධන ප්‍රගතිය





2.18 ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සතු අනන්‍ය වූ වත්කම්



නව නිපැයුම්කරුවන් සඳහා පිරිනැමෙන හැඳුනුම්පත



දේශබන්දු ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ අනුස්මරණ සමරු මුද්දරය

සහසක් නිමැවුම්
ஆயிரம் படைப்புகள்
Sahasak Nimavum
නවෝත්පාදනයේ
ශ්‍රී ලාංකේය
ප්‍රවේශය

අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලිය

IFIA
INTERNATIONAL FEDERATION OF INVENTORS' ASSOCIATIONS

ජාත්‍යන්තර නව නිපැයුම් සංගමයේ සාමාජිකත්වය

WIIPA
WORLD INVENTION INTELLECTUAL PROPERTY ASSOCIATION

ලෝක නවෝත්පාදන හා බුද්ධිමය දේපළ සංගමයේ සාමාජිකත්වය

නව නිපැයුම් දිරිය
புத்தாக்கத்துக்கு கைகொடுத்தல்

නව නිපැයුම් වාණිජකරණ මට්ටම දක්වා වැඩි දියුණු කිරීම වෙනුවෙන් සහාය දක්වන ව්‍යාපෘතිය

IAFM SL

නව නිපැයුම් වාණිජකරණ මට්ටම දක්වා වැඩි දියුණු කිරීම වෙනුවෙන් සහාය දක්වන ව්‍යාපෘතිය



"සහසක් නිමැවුම්" විශිෂ්ටයන්ට පිරිනැමෙන ' දසිස්" කුසලානය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

වාර්ෂික වාර්තාව

2019

2019 දෙසැම්බර් 31
දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශනය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

මූල්‍ය තත්ත්ව විස්තරය

දෙසැම්බර් 31 න් අවසන් දිනට	සටහන්	2019	2018 නැවත සකස් කල
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	**101,732,442**	101,940,693
උත්සව අත්තිකාරම්		**3,300**	3,300
ණයගැතියෝ		**1,010**	1,250
වෙනත් ලැබීම්		**56,401**	-
නැවත ලැබිය යුතු තැන්පතුව	2	**2,405,000**	2,410,000
දිගුකාලීන අපදා ණය		**676,723**	432,824
ජාතික ආධුනිකත්ව සහ පුහුණු අධිකාරිය වෙතින් ලැබීම්		**7,560**	7,560
වෙනත් අත්තිකාරම්		**136,633**	136,633
නව නිපැයුම්කරුවන්ගේ ණය අරමුදල		**10,289,283**	10,353,923
අනෙකුත් කොන්ත්‍රාත්තුමය සේවා සඳහා පූර්ව ගෙවීම්		**701,375**	507,972
(අඩු කළා) අඩමාන ණයකරුවන් සඳහා වෙන්කිරීම් (100%)	3	**(9,802,964)**	(9,802,964)
කුලිය පූර්ව ගෙවීම්		**1,617,188**	3,773,438
ඉන්ධන තැන්පතු		**100,000**	100,000
ටී ෂර්ට් තොග	4	**415,265**	675,885
ලිපි දුව්‍ය තොග	4	**485,246**	431,446
		108,824,461	**110,971,960**
ජංගම නොවන			
නව නිපැයුම්කරුවන්ගේ ණය අරමුදල		**236,600**	662,300
ආපදා ණය		**2,493,253**	1,602,459
දේපළ, පිරියත හා උපකරණ	5	**9,942,275**	6,395,032
		12,672,128	**8,659,791**
මුළු වත්කම්		**121,496,589**	**119,631,751**
අරමුදල් සහ බැරකම්			
ජංගම බැරකම්			
ණයහිමි	6	**3,862,139**	4,800
උපචිත වියදම්	7	**12,070,928**	1,745,516
		15,933,067	1,750,316
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික වෙන්කිරීම්	8	**2,820,257**	2,112,204
IAFM-SL ව්‍යාපෘතිය	9	**46,472,155**	46,472,155
කාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම	10	**51,191,096**	46,240,087
ප්‍රාග්ධන දායක අරමුදල	11	**(3,842,091)**	9,756,200
නව නිපැයුම්කරුවන්ගේ අරමුදල	12	**8,998,495**	8,998,495
මුළු බැරකම්		**121,572,979**	**115,329,457**
ශුද්ධ වත්කම්		**(76,390)**	**4,302,294**
ශුද්ධ වත්කම්/ හිමිකම්			
සම්මුවිචිත අරමුදල		**(76,390)**	4,302,294
මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්		**(76,390)**	**4,302,294**

පිටු අංක 43 සිට 51 දක්වා ඇති අවසාන ගිණුම් ප්‍රකාශනයේ සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි අත්‍යාවශ්‍ය කොටස වේ.

ඩී. ඒ. සරත්චන්ද්‍ර
සහකාර අධ්‍යක්ෂ (මුදල්)

එන්. එන්. ඩබ්. දොලවත්ත
අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.

මෙම මූල්‍ය ප්‍රකාශය සැකසීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

මෙම මූල්‍ය ප්‍රකාශනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත පරිදි අත්සන් තැබේ.

මහාචාර්ය. ආර්. යූ. හල්වතුර
කොමසාරිස්

වෛද්‍ය. සනත් හෙට්ටිගේ
සහකාර කොමසාරිස්

කොළඹ

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා	සටහන්	2019	2018 නැවත සකස් කල
		රු.	රු.
ආදායම්			
රජයේ දායකත්වය			
රජයේ දායකත්වය - පුනරාවර්තන	13	42,699,775	48,818,700
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ව්‍යාපෘති වියදම්	17	69,430,417	83,186,939
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම		352,315	1,423,839
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ක්ෂය වීම් / ජංගම නොවන වත්කම්	5	1,815,558	1,677,411
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම ක්‍රමක්ෂය -යන්ත්‍ර හා උපකරණ		48,991	-
වෙනත් ආදායම්	14	359,143	67,782
මුළු ආදායම		**114,706,198**	**135,174,672**
වියදම්			
පුද්ගලික වේතන	15	17,557,905	17,184,502
පරිපාලන සහ ආයතනික වියදම්	16	29,719,337	34,050,059
ක්ෂය - ස්ථාවර වත්කම්	5	1,864,549	1,677,411
පාරිතෝෂික	8	708,053	624,461
නව නිපැයුම්කරුවන්ගේ දිරි දීමනා වියදම්	17	69,430,417	83,186,939
වෙනත් වියදම්	18	15,604	416,885
මුළු වියදම්		**119,295,864**	**137,140,257**
වසර සඳහා අතිරික්තය / (හිඟය)		**(4,589,666)**	**(1,965,586)**

පිටු අංක 43 සිට 51 දක්වා ඇති අවසාන ගිණුම් ප්‍රකාශනයේ සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි අත්‍යාවශ්‍ය කොටස වේ.

.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

	සටහන්	සම්මුවිචිත අරමුදල	මුළු ස්කන්ධය
		රු.	රු.
2018 ජනවාරි 01 දිනට ශේෂය		5,742,325	5,742,325
2018 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)		(1,982,586)	(1,982,586)
2017 වර්ෂයේ විදේශිය ගමන් වියදම් අධිවියදම් කිරීම් ප්‍රතිපූර්ණය කරගැනීම		37,896	37,896
2017 - පාඨමාලා ගාස්තු නැවත අයකර ගැනීම - ඩී. කේ. ගමගේ (කොළඹ විශ්ව විද්‍යාලය)		5,000	5,000
2017 වර්ෂයේ වාර්තා නොවිමේ වියදම් - කොන්ත්‍රාත්තුමය සේවා වියදම්		(10,000)	(10,000)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය		**3,792,635**	**3,792,635**
2018 වර්ෂය සඳහා වන ගැලපීම්			
මෙහෙයුම් වියදම් ප්‍රග්ධනීත කිරීම		17,000	17,000
වෙන්කරවා ගැනීමේ ගාස්තු - සහසක් නිමැවුම් ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශනය		(280,000)	(280,000)
මෙහෙයුම් පද්ධති වලට අදාල ක්ෂයවීම් වාර්තා කිරීම		(904)	(904)
ටී ෂර්ට් තොග වල ආරම්භක ශේෂය හා වියදම් ගැලපීම් කිරීම		325,775	325,775
ඉදිරියට කරන ලද රක්ෂණ වියදම්		166,883	166,883
ක්ෂය අධිවෙන් කිරීම		15,300	15,300
2018 - වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂයකරණය ගැලපීම		265,604	265,604
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කිරීම)		**4,302,294**	**4,302,294**
2019 ජනවාරි 01 දිනට ශේෂය		4,302,294	4,302,294
2019 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)		(4,589,666)	(4,589,666)
පෙර වර්ෂය සඳහා අවලංගු කරන ලද වියදම්		28,800	28,800
NERD ආයතනයෙන් ආපසු ලද පෙර වර්ෂයේ වියදම්		182,181	182,181
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය		**(76,390)**	**(76,391)**

පිටු අංක 43 සිට 51 දක්වා ඇති අවසාන ගිණුම් ප්‍රකාශනයේ සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි අත්‍යාවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා	සටහන්	2019 රු.	2018 නැවත සකස් කල රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන්			
අතිරික්තය/හිඟය		(4,589,666)	(1,965,586)
මුදල් නොවන සංචලන			
ක්ෂයවීම්	5	1,864,549	1,677,411
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ව්‍යාපෘති වියදම්	17	(69,430,417)	(83,186,939)
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම සම්බන්ධවෙනස්වීම්		(352,315)	(1,423,839)
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ක්ෂය / ජංගම නොවන වත්කම්		(1,864,549)	(1,677,411)
පෙර වර්ෂය සඳහා වන ගැලපීම්		-	1,472,797
පෙර වර්ෂයේ අවලංගු කරන ලද ගෙවීම්		28,800	-
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම්	8	708,053	624,461
අපහරණයෙන් ලද ලාභය		(300)	-
ඉවත් කිරීමේ අලාභ		15,360	416,885
ගැලපීම් :			
ණයගැතියන්වෙනස්වීම්		240	-
ලිපි ද්‍රව්‍ය තොග වෙනස්වීම්		(53,800)	(94,387)
ටී ෂර්ට් තොග වෙනස්වීම්		260,620	(350,110)
කුලිය පූර්ව ගෙවීම් වෙනස්වීම්		2,156,250	(716,498)
අනෙකුත් කොන්ත්‍රාත්තුමය සේවා සඳහා පූර්ව ගෙවීම් වෙනස්වීම්		(193,404)	-
උත්සව අත්තිකාරම් හිවෙනස්වීම්		-	(1,250)
ගෙවිය යුතු වියදම් හි වෙනස්වීම්		10,325,412	234,169
ලැබිය යුතු දැ හි වෙනස්වීම්		(56,401)	-
නැවත ගෙවිය යුතු තැන්පතුහි වෙනස්වීම්		5,000	1,131,500
ණයහිමියන්ගේ වෙනස්වීම්		3,857,339	(5,200)
පෙර වර්ෂය සඳහා මුදල්මය ලැබීම්		182,181	42,896
		(57,137,047)	**(83,821,102)**
පරිතෝෂික ගෙවීම්		-	(200,543)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(57,137,047)**	**(84,021,645)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	5	(5,427,862)	(1,773,560)
විකුණුම් මිල		1,010	-
ණය-නව නිපැයුම්කරුවන්ගේ අරමුදල් නැවත ගෙවීම්		490,340	604,900
ආපදා ණය ප්‍රදාන		(1,697,626)	(1,036,421)
ආපදා ණය නැවත ගෙවීම		562,933	309,731
SLECC ආයතනයේ විනාශ වූ බිම් ඇතිරිලි සඳහා ගෙවීම් - සහසක් නිමැවුම් 2017		-	(140,530)
නව නිපැයුම්කරුවන්ගේ අරමුදල හරහා ණය ප්‍රදාන		-	(1,300,000)
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීමේ වියදම්		-	(8,524,567)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(6,071,205)**	**(11,860,447)**
මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
ලැබූ ප්‍රාග්ධන ප්‍රවාහ		58,000,000	85,750,000
IAFM-SL ව්‍යාපෘතිය	9	-	50,599,755
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම	10	5,000,000	-
සහසක් නිමැවුම් ප්‍රදර්ශනය තුල දී වූ හානි සඳහා වන්දි පූර්ණය		-	16,400
ආපසු ගෙවිය හැකි තැන්පතුව - BMICH (අධි වෙන්කිරීම්)		-	354,972
IAFM-SL යටතේ බෙදා හරින ලද ප්‍රදාන	9	-	(9,127,600)
මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය		**63,000,000**	**127,593,527**
වසර තුළදී ශුද්ධ මුදල් හා මුදල් සමාන දේ (වැඩි වීම/ අඩු වීම)		(208,251)	31,711,437
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දේ		101,940,693	70,229,256
වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දේ		**101,732,442**	**101,940,693**
මුදල් හා මුදල් සමාන දේ විශ්ලේෂණය			
A/C No.033-1-001-0-1791066		905,441	2,880,945
A/C No.033-1-001-2-1791065		100,664,518	99,059,748
A/C No.204402131791066		162,483	-
		101,732,442	**101,940,693**

පිටු අංක 43 සිට 51 දක්වා ඇති අවසාන ගිණුම් ප්‍රකාශනයේ සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි අත්‍යාවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

අයවැය හා සංචිතයන් සංසන්දනය කිරීම

රු.

	අනුමත අයවැය		මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරන ලද සංචිත	
	2019	**2018**	**2019**	**2018**
පුනරාවර්ථනය	**50,000,000.00**	53,000,000.00	**42,699,775.00**	48,818,700.00
ප්‍රාග්ධනය	**90,000,000.00**	120,000,000.00	**58,000,000.00**	85,750,000.00
එකතුව	**140,000,000.00**	**173,000,000.00**	**100,701,794.00**	**134,568,700.00**

වර්ෂය	රජයේ දායකත්වය ප්‍රාග්ධන (ශ්‍රී. ලං. රු)
1991	163,050.00
1992	1,700,000.00
1993	-
1994	250,000.00
1995	196,000.00
1996	113,500.00
1997	757,000.00
1998	1,700,000.00
1999	290,000.00
2000	4,500,000.00
2001	2,870,000.00
2002	700,000.00
2003	2,500,000.00
2004	621,000.00
2005	5,997,000.00
2006	33,991,000.00
2007	37,100,000.00
2008	24,106,000.00
2009	15,765,000.00
2010	4,500,000.00
2011	6,151,010.00
2012	21,562,000.00
2013	17,061,000.00
2014	40,000,000.00
2015	30,269,992.00
2016	57,248,655.00
2017	73,133,822.00
2018	85,750,000.00
2019	58,000,000.00

විශේෂිත ව්‍යාපෘති (අයවැය යෝජනාවන් - 2017)

ව්‍යාපෘතියේ නම	රාජ්‍ය ප්‍රාග්ධනයන්	
	2019	**2018**
IAFM-SL ව්‍යාපෘතිය	-	50,599,755.00
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම	**5,000,000.00**	-

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පරිපාටීන්

1. කොමිසමේ තොරතුරු

1.1 ආයතනය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම් දිරි ගැන්වීමේ පනත යටතේ නව නිපැයුම් දිරිගැන්වීම , ප්‍රවර්ධනය හා නිෂ්පාදන සහ ඒ සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.
කොමිසම ක්‍රියාත්මක වන්නේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ විෂය පථය යටතේය.
2019 වර්ෂයේ කොමිසමේ කාර්යාලය, අංක 46 සහ 48, කොටා පාර, කොළඹ 08 හි පිහිටා ඇත.

2. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම වන්නේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාලව ව්‍යවස්ථාපිත අවශ්‍යතා සඳහා වේ.

2.1 අනුකූලතා ප්‍රකාශනය

විගණකාධිපති සහ මූල්‍ය හා සැලසුම් අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ කමිටුව විසින් නියම කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිසමේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදි.

මෙම මූල්‍ය ප්‍රකාශන වල පහත සඳහන් අංශ ඇතුලත් වේ.

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශනය
- ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලය සතු වගකීමකි.

2.3 ඇගයීම් කිරීමේ පදනම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත සකස් කර ඇති අතර උද්ධමන සාධක සඳහා කිසිදු වෙන්කිරීමක් සිදු කර නොමැත.

2.4 ව්‍යවහාර මුදල් ඉදිරිපත් කිරීම හා ක්‍රියාකාරිත්වය

කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය ආයතනයේ ක්‍රියාකාරී මුදල් වේ. මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කෙරේ.

2.5 ප්‍රමාණාත්මක බව, හිලව් කිරීම, වැටයිම් කිරීම

ප්‍රමාණාත්මක බව

සමාන අයිතමයන්හි ප්‍රමාණාත්මක අගයන් මූල්‍ය ප්‍රකාශයන්හි වෙන් වෙන්ව දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම පිලිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 1 මගින් අවසර ලබා දී ඇති පරිදි ප්‍රමාණාත්මක නොවන අයිතමයන් ඒවායේ ස්වරූපය හා ක්‍රියාකාරීත්වයේ අසමානතාවය පදනම් කරගනිමින් වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශ දක්වා ඇත.

හිලව් කිරීම

රාජ්‍ය අංශයට ගිණුම්කරණ ප්‍රමිති වලට අවශ්‍ය පරිදි අවසර දී ඇත්නම් මූල්‍ය ප්‍රකාශන වලින් වත්කම් වගකීම් ආදායම් වියදම් හිලව් කිරීම නොකරයි.

වැටයිම් කිරීම

මූල්‍ය ප්‍රකාශන වල ඇති මුදල ආසන්නතම රුපියල් වලට එකතු කර ඇත.

2.6 අඛණ්ඩ පැවැත්ම

කොමිසමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන වේ.

2.7 වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවීම්

වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවීම් යනු වාසිදායක හා අහිතකර සිදුවීම් වන අතර ඒවා වාර්තා කිරීමේ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරණ ලද දිනය අතර වේ.
මේ සම්බන්ධයෙන් මෙම වර්ෂය සඳහා වාර්තා කිරීමේ කාලයෙන් පසුව කිසිදු සිදුවීමක් නොමැත.

3. විදේශ මුදල් ගණුදෙනු

ගණුදෙනු සිදුකරන අවස්ථාවේ පවත්නා විනිමය අනුපාතය අනුව සියළුම විදේශ විනිමය ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය වේ.

ශ්‍රී. ල. ගි. ප්‍ර. 21 අනුව ආයතනය විසින් විදේශ මුදල් අයිතම එහි ක්‍රියාකාරි මුදල් බවට පරිවර්තනය කරන අතර ඒ අනුව එම පරිවර්තනය වාර්තා කරනු ලැබේ.

4. දේපල හා උපකරණ

භුක්තිය ගැනීමේ පදනම

දේපල හා උපකරණ යනු සේවා සඳහා හෝ පරිපාලනමය අරමුණු සඳහා තබා ඇති ස්පර්ශ අයිතම වන අතර ඒවා වසරකට වැඩි කාලයක් තුල භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

ඇගයීමේ පදනම

වත්කමක් ලෙස පිලිගැනීමට සුදුසුකම් ලබන දේපල හා උපකරණ අයිතමයක් මුලින් මනිනු ලබන්නේ එහි පිරිවැයෙනි. පිරිවැයට වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපනය වන වියදම් සහ එහි කොටසක් එකතු කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන පිරිවැය ඇතුලත් වේ.

මිලදී ගන්නා ලද අදාල උපකරණ වල ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍ය වන පරිගණක මෘදුකාංග වැනි දෑ එම උපකරණ වල කොටසක් ලෙස ප්‍රාග්ධනීත කර ඇත.

දේපල හා උපකරණ වල කොටස් වලට විවිධ ප්‍රයෝජනවත් ජීවිත කාලය ඇති වීට, ඒවා දේපල හා උපකරණ වල වෙනම අයිතම (ප්‍රධාන කොටස්) ලෙස ගණන් ගැනේ.

අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා විවිධ මූල්‍ය කාලසීමාව තුළ ලාභය හෝ අලාභය ප්‍රකාශනයට ගලපනු ලැබේ.

පවත්නා වත්කම් වල මෑතකදී තක්සේරු කරන ලද කාර්යසාදනයේ ප්‍රමිතියට වඩා අනාගත ආර්ථික ප්‍රතිලාභය වැඩි නම් ප්‍රතිසංස්කරණය මගින් හඳුනා ගත හැකි කොටසක් ප්‍රතිස්ථාපනය කරයි.

අදාල වත්කම් වල ඉතිරිව ඇති ප්‍රයෝජනවත් කාලය තුල ප්‍රධාන අලුත්වැඩියාවන් ක්ෂය කරනු ලැබේ.

ක්ෂය

දේපල උපකරණ අයිතම වල එක් එක් කොටස් හි ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කර ලාභ අලාභ ප්‍රකාශනයේ ක්ෂය වීම් ලෙස දක්වා ඇත.

වත්මන් හා සන්සන්දනාත්මක වසර සඳහා ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත පරිදි වේ.

වත්කම් පන්තිය	වාර්ෂික අනුපාතය	කාලය
ගෘහ භාණ්ඩ උපකරණ	15%	6 2/3
කාර්යාලයීය උපකරණ	20%	05
මූලාකෘති සැලසුම් සහ නාම පුවරු	10%	10
මෝටර රථ හා වාහන	20%	05
ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා	20%	05
රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර්	20%	05
කාර්යාලයීය සවිකුරු	15%	6 2/3
තාක්ෂණ බීජෞෂණාගාර යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	20%	05

2014 ජනවාරි 01 වන දින සිට වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 7 භාවිතා කෙරේ.

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල හා උපකරණ

මූල්‍ය තත්වයේ දිනය වන විටත් භාවිතයේ පවතින කොමිසම සතු සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපල හා උපකරණ වල පිරිවැය පහත පරිදි වේ.

දෙසැම්බර් 31 න් අවසන් දිනට	2019 (රු.)	2018 (රු.)
ගෘහ භාණ්ඩ උපකරණ	708,582	722,747
කාර්යාලයීය උපකරණ	6,214,432	5,102,156
මෝටර රථ හා වාහන	16,470,191	16,389,161
ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා	1,266,440	1,279,490
රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර්	111,750	102,500
එකතුව	**24,771,395**	**23,596,054**

සක්‍රීය භාවිතයෙන් ඉවත් කරන ලද දේපල හා උපකරණ

කොමිසමේ පහත සඳහන් දේපල හා උපකරණ වාර්තා කරන දිනට සක්‍රීය භාවිතයෙන් ඉවත් කරන ලදී.

දෙසැම්බර් 31 න් අවසන් දිනට	2019 (රු.)	2018 (රු.)
කාර්යාලයීය උපකරණ	98,887	98,887
මූලාකෘති සැලසුම් සහ නාම පුවරු	110,805	110,805
ප්‍රදර්ශන ශාලා	37,690	37,690
කාර්යාලයීය සවිකුරු	1,065,682	1,085,682
එකතුව	**1,313,064**	**1,333,064**

5. විස්තර කරන ලද දායක සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

අදාල ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව සේවකයන්ගේ අර්ථ සාධක අරමුදල් දායකත්වය සහ සේවක භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයින් සුදුසකම් ලබයි.
සේවක අර්ථසාධක අරමුදල කොමිසමෙන් 15% ක් සහ සේවකයන්ගෙන් 10% ක් සේවකයන්ගේ දළ වැටුපෙන් දායක වේ.
සේවකයන්ගේ දළ වැටුපෙන් 3% ක් කොමිසම සේවක භාර අරමුදලට දායක වේ.

6. අරමුදල්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට රජයේ දායකත්වය, රජයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව අයිතම 02ක් යටතේ සපයනු ලැබේ.

1. පුනරාවර්ථන වියදම් සඳහා අරමුදල්
2. ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල්

ශ්‍රී. ල. ගි. ප්‍ර. 20 අනුව පුනරාවර්තන ප්‍රදාන ආදායම් හා වියදම් ගිණුමට ගෙන යන අතර ප්‍රාග්ධන ප්‍රදානය ඒ අනුව ගණනය කෙරේ.

කොමිසමේ පුනරාවර්තන වියදම් පහත සඳහන් පරිදි ආදයම් හා වියදම් ගිණුමේ දක්වා ඇත.

1. ආයතන හා පරිපාලන වියදම්
2. පෞද්ගලික වේතන

ප්‍රාග්ධන වියදම් නියෝජනය කරනු ලබන්නේ 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරි ගැන්වීමේ පනතේ අරමුණු සපුරාලීම සඳහා කොමිසම විසින් කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා වන වියදමයි.

7. මුදල් ප්‍රවාහය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 02 අනුව වක්‍ර ක්‍රමයට සකස් කර ඇත.

8. අරමුදල් එකතු කිරීම/ අනුග්‍රාහකයින්ගෙන් සහ තෙවන පාර්ශවයකින් ලැබෙන පරිත්‍යාග

කොමිසමේ ප්‍රතිපාද ගිණුම මඟින් පෙන්නුම් කරනුයේ අනුග්‍රහකයින්ගෙන් සහ තෙවන පාර්ශවයන්ගෙන් රැස් කරන ලද අරමුදල් වේ.

9. විදේශ මුදලින් සිදු කරන ගණුදෙනු

විදේශ මුදලින් සිදු කරන ගණුදෙනු ආයතනය විසින් ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල් බවට පරිවර්තනය කරනුයේ ශ්‍රී.ලං.ගි.ප්‍ර.21ට අනුවය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	2019 LKR	2018 Restated LKR
1 මුදල් හා මුදල් සමාන දෑ		
මුදල් පොත - 033100101791066	905,441	2,880,945
මුදල් පොත - 033100121791065	100,664,518	99,059,748
මුදල් පොත - 204402131791066 (විදේශ මුදල්)	162,483	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**101,732,442**	**101,940,693**
2 නැවත ලැබිය යුතු තැන්පතු		
Gavinro Property Developers	2,400,000	2,400,000
American Water (Pvt) Ltd	-	10,000
Express Water System (Pvt) Ltd	5,000	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**2,405,000**	**2,410,000**
3 අඩමාණ ණයකරුවන් සඳහා 100% වෙන් කිරීම		
ජනවාරි 01 දිනට ශේෂය	9,802,964	9,802,964
වර්ෂය සඳහා වෙන් කිරීම්	-	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**9,802,964**	**9,802,964**
4 තොග ඇගයීම (SLPSAS 9)		
වර්ෂය අවසානයේ ඇති ලිපි තොග (FIFO) ක්‍රමය පදනම් කරගනිමින් ශ්‍රී. ල. රා. ගි. ප්‍ර. අංක 09 අනුව ගණන්		
ලිපි ද්‍රව්‍ය		
ජනවාරි 01 දිනට ශේෂය	431,446	337,059
වර්ෂය තුළ මිලදී ගැනීම්	961,655	786,989
වර්ෂය තුළ වියදම්	(907,855)	(692,602)
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**485,246**	**431,446**
ටී - ෂර්ට්		
ජනවාරි 01 දිනට ශේෂය	675,885	199,375
වර්ෂය තුළ මිලදී ගැනීම්	-	998,450
වර්ෂය තුළ වියදම්	260,620	521,940
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**415,265**	**675,885**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

5 ක්ෂය - ස්ථාවර වත්කම්



	කාර්යාලයීය උපකරණ	ගෘහ භාණ්ඩ උපකරණ	මූලාකෘති සැලසුම් සහ නාම පුවරු	වාහන	ප්‍රදර්ශන කුටි	ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා	රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර්	කාර්යාලයීය සවිකුරු	යන්ත්‍ර සූත්‍ර හා සවිකුරු (තාක්ෂණ බිජෞෂණාගාර)	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය										-
2018 ජනවාරි 01 දිනට ශේෂය	12,744,164	2,201,254	316,800	16,470,191	165,120	1,371,191	1,000,550	1,941,908	-	**36,211,180**
වර්ෂය තුළදී එකතුවීම්	1,542,173	231,387	-	-	-	-	-	-	-	**1,773,560**
වර්ෂය තුළදී අපහරණයන්	(2,539,410)	(6,250)	(105,495)	-	(127,430)	(3,201)	(50,250)	(782,406)	-	**(3,614,442)**
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කරන ලද)	**11,746,927**	**2,426,391**	**211,305**	**16,470,191**	**37,690**	**1,367,990**	**950,300**	**1,159,502**	**-**	**34,370,296**
වර්ෂික ක්ෂයවීම්	-	-	-	-	-	910,060	-	-	4,517,802	**5,427,862**
වර්ෂය තුල වූ අපහරණයන්	(4,470)	(14,166)	-	-	-	(13,050)	-	(20,000)	-	**(51,686)**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**11,742,457**	**2,412,225**	**211,305**	**16,470,191**	**37,690**	**2,264,999**	**950,300**	**1,139,502**	**4,517,802**	**39,746,472**
									-	
සම්මුචිත ක්ෂය වීම්									-	
2018 ජනවාරි 01 දිනට ශේෂය	9,104,512	993,644	246,558	16,442,752	165,120	1,296,313	350,515	895,998	-	**29,495,410**
වර්ෂය තුළ ගෙවීම්	1,179,123	245,546	10,050	16,206	-	45,200	170,213	11,073	-	**1,677,411**
අපහරණයන්	(2,538,280)	(6,250)	(105,495)	-	(127,430)	(3,201)	(50,250)	(366,651)	-	**(3,197,557)**
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කරන ලද)	**7,745,356**	**1,232,941**	**151,113**	**16,458,958**	**37,690**	**1,338,312**	**470,478**	**540,420**	**-**	**27,975,264**
වර්ෂික ක්ෂයවීම්	1,301,200	255,547	10,050	11,233	-	58,713	167,742	11,073	48,991	**1,864,549**
අපහරණයන්	(2,868)	(14,166)	-	-	-	(13,050)	-	(5,532)	-	**(35,616)**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**9,043,688**	**1,474,321**	**161,162**	**16,470,191**	**37,690**	**1,383,975**	**638,220**	**545,961**	**48,991**	**29,804,197**
ශුද්ධ පොත් අගය									-	
2018 දෙසැම්බර් 31 දිනට	4,001,571	1,193,450	60,193	11,233	-	29,678	479,822	619,082	-	**6,395,032**
2019 දෙසැම්බර් 31 දිනට	**2,698,769**	**937,903**	**50,143**	**-**	**-**	**881,024**	**312,080**	**593,540**	**4,468,811**	**9,942,275**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2019 LKR	2018 Restated LKR
6 ගෙවිය යුතු වියදම්			
ණයහිමියෝ		3,862,139	4,800
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**3,862,139**	**4,800**
7 උපචිත වියදම්			
ගෙවිය යුතු පිරිසිදු කිරීමේ සහ සනීපාරක්ෂක වියදම්		59,411	58,509
ගෙවිය යුතු ජල ගාස්තු		7,837	6,411
ගෙවිය යුතු විදුලිය ගාස්තු		122,568	130,785
ගෙවිය යුතු දුරකථන ගාස්තු		39,782	54,020
ගෙවිය යුතු ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය		21,997	5,300
ගෙවිය යුතු විගණන ගාස්තු		1,724,300	1,236,233
ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු වියදම්		1,398	-
ගෙවිය යුතු අතිකාල දීමනා		13,572	3,443
ගෙවිය යුතු කොන්ත්‍රාත්තුමය සේවා සඳහා ගෙවීම්		141,980	93,635
සහසක් නිමැවුම් ප්‍රදර්ශනය සඳහා ගෙවිය යුතු		6,334,534	74,284
ගෙවිය යුතුවෙනත් දීමනා		96,500	-
ගෙවිය යුතු ගමන් ගාස්තු		4,070	-
ගෙවිය යුතු වාහන නඩත්තු හා සැකසීමේ වියදම්		25,982	-
ගෙවිය යුතු නව නිපැයුම්කරුවන් හා නව නිපැයුම් ප්‍රවර්ධනය		2,326,054	-
ගෙවිය යුතු ජාත්‍යන්තර ප්‍රදර්ශන වියදම්		111,003	-
පලාත් නව නිපැයුම් තරඟ හා ප්‍රදර්ශන සඳහා ගෙවිය යුතු වියදම්		177,000	41,500
ගෙවිය යුතු ලිපි ද්‍රව්‍ය වියදම්		111,686	-
ගෙවිය යුතු වැඩ බැලීමේ දීමනාව		-	41,395
ගෙවිය යුතු මුද්දර ගාස්තු වියදම්		1,950	-
ගෙවිය යුතු නව නිපැයුම් සමාජ පිහිටුවීමේ වියදම්		715,000	-
ගෙවිය යුතු පරිපාලන වියදම්		21,080	-
ගෙවිය යුතු ජේටන්ට් බලපත්‍ර සඳහා ගෙවීම්		13,225	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**12,070,928**	**1,745,516**
8 පාරිතෝෂික			
1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ අදාළ පාරිතෝෂික ගණනය කිරීම් සිදු කර ඇත.			
ජනවාරි 01 දිනට ශේෂය		2,112,204	1,688,286
වර්ෂය සඳහා වෙන් කිරීම්		708,053	624,461
වර්ෂය තුළ පාරිතෝෂික ගෙවීම්		-	(200,543)
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**2,820,257**	**2,112,204**
9 IAFM-SL ව්‍යාපෘතිය			
ජනවාරි 01 දිනට ශේෂය		46,472,155	5,000,000
වර්ෂය තුල ප්‍රදාන ලැබීම්		-	50,599,755
වර්ෂය තුල සිදුකරන ලද වියදම්		-	(9,127,600)
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**46,472,155**	**46,472,155**
10 තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම			
ජනවාරි 01 දිනට ශේෂය		46,240,087	54,764,654
වර්ෂය තුල ප්‍රධාන ලැබීම්		5,000,000	-
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම සඳහා වියදම්			
NERD		-	(8,524,567)
ක්‍රමක් ක්ෂය කිරීම් - රජරට විශ්ව විද්‍යාලය	5	(39,391)	-
ක්‍රමක් ක්ෂය කිරීම් - රුහුණු විශ්ව විද්‍යාලය	5	(9,599)	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**51,191,096**	**46,240,087**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2019	2018 Restated
		LKR	LKR
11 ප්‍රාග්ධන ප්‍රදානයන්			
ජනවාරි 01 දිනට ශේෂය		9,756,200	8,580,751
වර්ෂය තුල ප්‍රධාන ලැබීම්		58,000,000	85,750,000
ව්‍යාපෘති සඳහා සිදුකරන ලද වියදම්	17	(69,430,417)	(82,906,939)
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම		(352,315)	(1,423,839)
ස්ථාවර වත්කම් සඳහා වර්ෂික ක්ෂයවීම්	5	(1,815,558)	(1,691,808)
SLECC ආයතනයේ විනාශ වූ බිම් ඇතිරිලි සඳහා ගෙවීම් - සහසක් නිමැවුම් 2017		-	(124,130)
ආපසු ගෙවිය හැකි තැන්පතුව - BMICH (අධි වෙන්කිරීම්) - 2017		-	354,972
වැරදි ලෙස වාර්තාගත කරන ලද වියදම් නිවැරදි කිරීම - 2017		-	1,482,797
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**(3,842,091)**	**10,021,804**
ප්‍රග්ධනය ක්‍රමක් ක්ෂය කිරීම් ගැලපීම් - 2018		-	
ක්ෂය අධිවෙන් කිරීම		-	15,300
මෙහෙයුම් පද්ධති ප්‍රග්ධනීත කිරීමට ආදාල ක්ෂය		-	(904)
සහසක් නිමැවුම් ප්‍රදර්ශන පරිශ්‍රය වෙන්කරවා ගැනීම		-	(280,000)
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය			**9,756,200**
12 නව නිපැයුම්කරුවන්ගේ ණය අරමුදල			
ජනවාරි 01 දිනට ශේෂය		8,998,495	8,998,495
වර්ෂය තුල ප්‍රධාන ලැබීම්		-	-
Invent 2018 - යටතේ බෙදාහැරීම්		-	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය		**8,998,495**	**8,998,495**
13 රාජ්‍ය දායකත්වය			
රජයේ දායකත්වය පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.			
ශ්‍රී. ලං. ගි. ප්‍ර. 24ට අනුව			
පුනරාවර්තන ප්‍රදාන		42,699,775	48,818,700
ප්‍රාග්ධන ප්‍රදාන		58,000,000	85,750,000
වර්ෂය සඳහා		**100,699,775**	**134,568,700**
14 වෙනත් ආදායම්			
ආපදා ණය - පොළිය		117,617	65,282
විදේශ මුදල් - පොළිය		825	-
සුළු ආදායම්		78,500	2,500
අපහරණ ලාභ		300	-
සහසක් නිමැවුම් -විදේශ නව නිපැයුම්කරුවන් ලියාපදිංචි කිරීම සහ කුටි ගාස්තු		161,901	-
		359,143	**67,782**
15 පුද්ගලික වේතන			
වැටුප් සහ වේතන		9,729,078	8,647,730
ජීවන වියදම් දීමනාව		2,209,035	2,274,455
වෘත්තිය දීමනා		143,806	132,700
වෙනත් දීමනා		583,500	-
වැටුප් රහිත නිවාඩු ගාස්තු		(14,895)	(2,369)
වැඩ බැලීමේ දීමනාව		115,438	108,895
ගැලපුම් දීමනාව		145,631	752,265
සේවා නියුක්තිකයන්ගේ අර්ථ සාධක අරමුදල		1,788,483	1,637,972
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල		357,697	327,594
අතිකාල සහ නිවාඩු දින ගෙවීම්		872,738	457,850
කොමිසමේ සාමාජිකයින් සඳහා පාරිශ්‍රමිකය ගෙවීම්		1,275,080	1,423,570
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම		352,315	1,423,839
		17,557,905	**17,184,502**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		2019	2018 Restated
		LKR	LKR
16	**ආයතන හා පරිපාලන වියදම්**		
	දේශීය ගමන් වියදම්	508,121	195,837
	විදේශීය ගමන් වියදම්	32,550	4,072,159
	ලිපි ද්‍රව්‍ය	1,054,432	771,693
	ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	658,844	531,594
	කාර්යාලයීය උපකරණ - අලුත්වැඩියාව සහ නඩත්තුව	161,672	48,129
	වාහන - අලුත් වැඩියාව සහ නඩත්තුව	1,243,257	1,416,021
	තැපැල් ගාස්තු	102,851	38,720
	සන්නිවේදන ගාස්තු	639,103	760,725
	උපයෝගි වියදම්	42,645	25,178
	කොන්ත්‍රාත්තුමය වියදම්	1,921,055	1,912,658
	විදුලි ගාස්තු	1,784,374	1,768,387
	පිරිසිදු කිරීමේ වියදම්	700,244	667,765
	ජල ගාස්තු	94,614	121,544
	කුලී වියදම්	17,173,438	16,808,640
	සංග්‍රහ වියදම්	268,909	235,035
	පුවත්පත් සහ වාර සඟරා	1,871	760
	විගණන ගාස්තු	488,067	925,300
	මෙහෙයුම් කල්බදු වියදම්	2,387,400	2,387,400
	වෙනත් පරිපාලන වියදම්	455,890	1,362,514
		29,719,337	**34,050,059**
17	**නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ වියදම්**		
	මූලික මට්ටමේ පසුවන නව නිපැයුම්කරුවන් හා නව නිපැයුම්කරණය දිරිගැන්වීම	417,440	472,018
	පළාත් නව නිපැයුම් ප්‍රදර්ශන හා තරඟය	3,865,778	3,858,841
	නව නිපැයුම්කරුවන්ගේ දිනය වැඩසටහන	-	8,501,654
	"Innova Minds" වැඩසටහන	365,730	11,107,243
	නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන ප්‍රවර්ධන වැඩසටහන	6,935,565	12,364,875
	ජනාධිපති සම්මාන ප්‍රධාන උළෙල	18,000	3,666,072
	විනිශ්ච මණ්ඩලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම්	-	193,500
	සහසක් නිමැවුම් ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය	22,098,263	26,050,921
	ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය	20,121,250	16,175,756
	යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම	3,803	21,122
	පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා මූල්‍ය දායකත්වය	172,504	774,937
	දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	1,198,444	-
	වැඩමුළු / සම්මන්ත්‍රණ පැවැත්වීම	159,553	-
	පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට නව නිපැයුම්කරුවන්ට සහයවීම	475,438	-
	නව නිපැයුම් සමාජය පිහිටුවීම	1,910,377	-
	නව නිපැයුම්කරුවන් සමඟ කාර්තුමය වශයෙන් හමුවීම් සංවිධානය	369,890	-
	ශිල්පසේනා	11,318,383	-
		69,430,417	**83,186,939**
18	**වෙනත් වියදම්**		
	අපහරණ ලාභ (අනෙකුත් උපකරණ)	15,360	416,885
	විදේශ මුදල් පුරෝකථන මුදල් ගනුදෙනුවේ පාඩුව	206	-
	WHT - විදේශ මුදල් ගිණුම	38	-
		15,604	**416,885**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TEC/B/SLIC/19/1/43 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2020 සැප්තැම්බර් 09 දින

සභාපති

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත :-

01. ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TEC/B/SLIC/19/1/43 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2020 සැප්තැම්බර් 09 දින

සභාපති

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිසමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

[illegible] No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 78 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naod.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

නව නිපැයුම් ප්‍රවර්ධන වියදම් සඳහා රු 58,000,000 ක ප්‍රදානයක් සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු අතර එම මුදල ද ඇතුළත්ව මෙකී ප්‍රවර්ධන වියදම් සඳහා රු.69,430,417 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ දරා තිබුණි. එසේ වුවත් ගිණුම්කරණ දෝෂයක් හේතුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු මුදලට අමතරව කොමිසම විසින් දරන ලද වියදම් ද ඇතුළත්ව රු 69,430,417 ක් භාණ්ඩාගාර ප්‍රදාන ලෙස ලැබුණු ආදායමක් ලෙස හඳුනාගෙන එම මුදල භාණ්ඩාගාර ප්‍රදාන ගිණුමෙන් අඩුකර දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම රු 3,842,091 ක සෘණ ශේෂයක් ලෙස ද වර්ෂයේ ඌනතාවය රු 11,430,417 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කෙරුණි. මෙකී සමස්ත ගැලපීම් වල ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිසමේ ශුද්ධ වත්කම්වල අගය රු.76,390 ක සෘණ අගයක් ලෙසද දැක්වුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිසම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විසින් කොමිසම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිසමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිසමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිසමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිසමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිසමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිසම පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිසම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිසමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය කොමිසමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

03. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම සඳහා මූල්‍ය ආධාර ලබාදීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂයේ අගෝස්තු වන විට නව නිපැයුම්කරුවන් 16 දෙනෙකු සඳහා රු 23,530,000 ක් ණය/ ආධාර වශයෙන් ලබා දීමට යෝජනා කර තිබුණ ද 2020 පෙබරවාරී වන විටත් එම ආධාර ලබාදී අවශ්‍ය උපකරණ මිළදී ගැනීම් සම්පූර්ණ කරදීමට කොමිසම පියවර ගෙන නොතිබුණි.

(ආ) වැවිලි කර්මාන්ත අංශය සඳහා වන ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මධ්‍ය පරිමාණ තේ වැවලිකරුවන් මුහුණ දෙන ගැටළු නිරාකරණය සඳහා ශ්‍රී ලංකා තේ වතු අයිතිකරුවන්ගේ සංගමය සමඟ වැඩසටහන් සංවිධානය කිරීම, තරඟ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, තරග පැවැත්වීම, තේ කර්මාන්තය හා සම්බන්ධ පෞද්ගලික ආයතනයන්හි සහභාගිත්වයෙන් යුතු විනිශ්චය මණ්ඩලයක් මගින් තරඟ විනිශ්චය ආදී කටයුතු සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණ ද 2020 වර්ෂයේ පෙබරවාරී අවසාන වන විටත් මධ්‍ය පරිමාණ තේ වැවිලි කරුවන් මුහුණ දෙන ගැටළු නිරාකරණය සඳහා නව නිපැයුම්කරුවන්ගේ දායකත්වය ලබා ගැනීම වෙනුවෙන් හඳුනාගත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) තාක්ෂණ බිජෞෂණාගාර මධ්‍යස්ථාන ස්ථාපනය කර ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම අයවැය යෝජනා අනුව කොමිසමට පැවරී ඇති කාර්යභාරයක් බැවින් ඒ සඳහා රු.මිලියන 51.2 ක ආධාර ලබාදී තිබුණි. එසේ වුවත් රජරට හා රුහුණු විශ්වවිද්‍යාලවලට අනුබද්ධව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ කාර්යයන් සැලසුම් කළ පරිදි ඉටුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති